The Faculty Journal of Humanities and Social Sciences, Volume 10, Issue 02, December 2021

# මහියංගණයේ සමන් දෙවියන්ගේ අනන්‍යතාව: ද්‍රෝහියා පිටුදැකීම සහ ඉතිහාසකරණයේ බලහත්කාරය

එල්. ඩී. එස්. විතාරණ

සමාජ විද්‍යා අධ්‍යයනාංශය

කැළණිය විශ්වවිද්‍යාලය

svitharana@kln.ac.lk

**සංක්ෂේපය:**

රත්නපුරයේ සමන් දේවාලයේ දී පුද-පූජා ලබන්නා වූ ද, සබරගමුවේ ශ්‍රී පාදස්ථානය ආරක්ෂා කරන බවට විශ්වාස කෙරෙන්නා වූ ද සමන්[1] ශ්‍රී ලංකාවේ බෞද්ධ දේව මණ්ඩලයේ වැදගත් ස්ථානයක් උසුලන දෙවියෙකි. එහෙත් ඌව පළාතේ මහියංගණ ප්‍රදේශය ආශ්‍රිත වැදි ජනතාව සහ තමන් වැද්දන්ගෙන් පැවතෙන්නේ යැයි පිළිගන්නා එම ප්‍රදේශයේ සිංහල ජනතාවට අනුව එම දෙවිඳුගේ මූලස්ථානය මහියංගණ-අලුත්නුවර ඓතිහාසික මහ සමන් දේවාලය යි. ලංකාවේ පැරණිතම සහ ප්‍රධානතම බෞද්ධාගමික පුදබිමක් වන මහියංගණ ස්තූපය අසල ඇති එම දේවාලය ආශ්‍රිත පුද-පූජා, වත් පිළිවෙත් සහ ප්‍රදේශයේ ජනතාව අතර තවමත් පවත්නා ජනශ්‍රැති සහ පුරාණෝක්ති පරීක්ෂා කරන විට ලංකා ශිෂ්ටාචාරයේ ගොඩනැගීම සහ එම ශිෂ්ටාචාරයට ජන කණ්ඩායම් අනුගත කර ගැනීම පිළිබඳ සමාජවිද්‍යාත්මක සහ මානවවිද්‍යාත්මක වශයෙන් වැදගත් නිරූපණයක් ඒවායෙන් පිළිබිඹු වන බව පෙනී යයි. තව දුරටත් සිදු කර ගෙන යන පර්යේෂණයක මේ වන විට රැස් කර ඇති දත්ත මත පදනම් වන මේ ලිපියේ අරමුණු මහියංගණයේ සමන් දෙවියන්ගේ අනන්‍යතාව හඳුනා ගැනීම, මහියංගණයේ ඓතිහාසික මහ සමන් දේවාලය ආශ්‍රිත ව සිදු වන පුද-පූජා සහ යාතුකර්මවලින් පිළිබිඹු වන ඓතිහාසික දේශපාලනික සහ සමාජ-සංස්කෘතික ක්‍රියාවලිය හඳුනා ගැනීම සහ සමන් දෙවිඳුන් පිළිබඳ මහියංගණයේ ජනතාව අතර ඇති ජනශ්‍රැති සහ පුරාණෝක්තිවල ඓතිහාසික සහ සමාජීය වැදගත්කම උපුටා දැක්වීමත් ය. එම අරමුණුවලට අදාළ ව මෙම පර්යේෂණයේ මූලික පර්යේෂණ ගැටලුව වන්නේ මහියංගණයේ දී සමන් දෙවිඳුන් පිළිබඳ කියැවෙන ජනශ්‍රැති සහ පුරාණෝක්තිවල වැදගත්කම කුමක් ද යන්න යි. ලංකාවේ ඉතිහාසය ලිවීමේ දී බෞද්ධාගමික වංශකතා සම්ප්‍රදාය විසින් ලියා සහතික කරන ලද ඓතිහාසික වාර්තාකරණය මතභේදාත්මක ය යන්න මෙන් ම ඉතිහාසය ලිවීමේ එම සම්ප්‍රදායේ විස්තර වන ශිෂ්ටාචාරකරණ ක්‍රියාවලියේ දී පීඩාවට පත් කරන ලද, නොසලකා හරින ලද හෝ අමතක කරන ලද, එමෙන් ම තමන්ගේ ඉතිහාසය ලියා සහතික කර ගැනීමට හැකියාවක් නොතිබුණු ජන කොටස් එකී ශිෂ්ටාචාරකරණය පිළිබඳව දක්වූ ප්‍රතිචාර ද මේ ජනශ්‍රැති සහ පුරාණෝක්තිවලින් නිරූපණය වන බව මෙම පර්යේෂණයේ දී අප එළඹුණු නිගමනය යි.

[1] ජනප්‍රිය ව්‍යවහාරයේ දී මෙම දෙවියන් 'සුමන සමන්' ලෙස හැඳින්වූවත් පාලි බසේ 'සුමන' යන වචනය සහ සිංහල බසේ 'සමන්' යන වචනය එක ම අරුතක් ගෙන දෙන්නකි. එබැවින් මෙම සමස්ත ලිපියේ ම 'සමන්' දෙවියන් යන ව්‍යවහාරය භාවිත කර ඇත.

මහියංගණයේ සමන් දෙවියන්ගේ අනන්‍යතාවː ද්‍රෝහියා පිටුදැකීම සහ ඉතිහාසකරණයේ බලහත්කාරය

**මුඛ්‍ය පදඃ** ජනශ්‍රැති සහ පුරාණෝක්ති, මහියංගණ-අලුත්නුවර ඓතිහාසික මහ සමන් දේවාලය, වැදි ජනතාව, සමන් දෙවියන්,

## Abstract:

The God Saman is considered to be an important deity among the Buddhist pantheon in Sri Lanka. He is believed to be the guardian of the Adam’s Peak of the Sabaragamuwa Province as well as the God who is worshipped at the Saman Devala in Rathnapura. However, according to the Veddah Community (indigenous people of the island) as well as the Sinhalese people who consider themselves to be descendants of the Veddah Community in Mahiyangana area of the Uva Province, this deity’s main base is the Aluthnuwara-Mahiyangana Saman Devalaya. A close examination of the rituals practiced at this Devala that is in close proximity to the Mahiyangana Stupa, which is one of the oldest and main Buddhist sites of worship in Sri Lanka, as well as the folklore and legends common among the people of that area, shows that they are an important sociological and anthropological representation of the construction of the civilization of Lanka as well as converting the people to that civilization. The objectives of this essay that is based on an ongoing socio-anthropological research study are to establish the identity of the deity Saman of Mahiyanganaya, to identify the historical, political and socio-cultural processed represented by the devotional practices and rituals associated with the Mahiyangana Saman Devalaya, and to cite the historicale and social significance of the folklore and legends among the people of the Mahiyanganaya area. The main research question of this study is that what is the significance of folklore and legends on God Saman prevailing in Mahiyangana area?  This paper concludes that the documentation of the history of Sri Lanka carried out by the Buddhist tradition of writing and authenticating history is necessarily contentious; the folklore and legends discussed in this paper represent the response of communities who were unable to authenticate their own history through written records and who were oppressed, disregarded, and forgotten by the process of civilization recorded by dominant Buddhist historians.

**Keywords:** Folklore and legends, Saman Devala of mahiyangana-Aluthnuwara, The Deity Saman, Veddah Community

### හැඳින්වීම

ලංකාවේ දේශීය බෞද්ධ දේව මණ්ඩලයේ ප්‍රධානතම දෙවියකු ලෙස පිදුම් ලබන මෙන්ම ශ්‍රීපාදස්ථානය සහ සමන්තකූඨය ආශ්‍රිත ප්‍රදේශය ආරක්‍ෂා කරනවා යැයි විශ්වාස කරන සමන් දෙවියන් පිළිබඳ ව ලංකා ඉතිහාසයේ දී පළමු වරට අසන්නට ලැබෙන්නේ බුදුරජාණන්

වහන්සේගේ ප්‍රථම ලංකාගමනය හා සම්බන්ධ විචිත්‍රවත් ඓතිහාසික වංසකථා පුවත්වල දී ය. මහාවංසයේ පළමු වන පරිච්ඡේදයේ 33-36 ගාථාවලට අනුව, බුද්ධ ශාසනය වසර පන්දහසක් කල් පවතින්නේ ලංකාද්වීපයේ යැයි දිවැසින් දක්නා බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පැමිණීමෙන් නවවන දුරුතු මස පුර පසළොස්වක් පොහෝ දිනයේ දී (ක්‍රි. පූ. 528 හෝ බුද්ධ වර්ෂ 01 දී) ලංකාවට වැඩම කරන්නේ යක්ෂ ගෝත්‍රිකයන් දමනය කර බුදුසමය මෙරට ස්ථාපිත වීමට හැකි වන පරිදි රට පාරිශුද්ධත්වයට පත් කරනු පිණිස ය. මෙදින දිවයින පුරා ම සිටි යක්‍ෂ ගෝත්‍රිකයන් මහියංගණයේ 'මහානාග උද්‍යානය' නම් ස්ථානයක දී රැස්වීමක් පවත්වමින් සිටි අතර එතැනට පැමිණි බුදුරජාණන් වහන්සේ ප්‍රාතිහාර්ය පා යක්‍ෂයන් 'ගිරිදීප' නම් දිවයිනට පළවා හැරියහ. යක්‍ෂ ගෝත්‍රිකයන් දමනය කිරීමෙන් පසු එහි දී උන්වහන්සේ දේශනා කළ ධර්මය අසන්නට පැමිණ සිටි දෙවිවරුන් අතර සමන්ත කූටවාසී සමන් දෙවිඳු ද විය. බණ ඇසීමෙන් සෝවාන් ඵලයට පත් වූ ඒ දෙව් රජ බුදුරජාණන් වහන්සේ නික්ම යාමට සූදානම් වූ විට උන්වහන්සේ සිහි වීමට සහ වන්දනාමාන කිරීමට සුදුසු පූජ්‍ය වස්තුවක් ඉල්ලා සිටියේ ය. එවිට බුදුරජාණන් වහන්සේ තම හිස පිරිමැද කේශ ධාතු ස්වල්පයක් ලබා දුන් බවත් එම කේශ ධාතු තැන්පත් කර සත්රියන් ඉන්ද්‍රනීලමය චෛත්‍යයක් මහියංගණයේ ඉදි කරවන ලද බවත් මහාවංසයේ කියැවේ (මහාවංසය, 1996).

මෙම මහාවංස වාර්තා පදනම් කර ගෙන පශ්චාත් කාලීන ව ලියැවුණු විස්තරාත්මක බෞද්ධ ග්‍රන්ථවලටත්, එම වංශකතා සහ බෞද්ධ ග්‍රන්ථාගත විස්තර පදනම් කර ගත් ශාස්ත්‍රීය ලේඛනවලටත්, ඒ අනුව ගොඩනැගී ඇති ලංකාවේ ජනප්‍රිය විශ්වාසවලටත් අනුව, ශ්‍රීපාදස්ථානය සහ සමන්තකූටය ආශ්‍රිත ප්‍රදේශය ආරක්‍ෂා කරන දේශීය බෞද්ධ දේව මණ්ඩලයේ ප්‍රධානතම දෙවියකු වන සමන් දෙවිඳුන්ගේ මූලස්ථානය රත්නපුර මහ සමන් දේවාලය යි. එහෙත් ඌව පළාතේ බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයට අයත් මහියංගණයේ ඓතිහාසික මහ සමන් දේවාලයේ දී "... සිද්ධ පස්වාන් දහසකට අවසර පස්වාන් දහසකට කීර්ති පස්වහන් දහසකට ශුද්ධ ශ්‍රී සුමන සමන් දිව්‍ය රාජෝත්තමයාණන් වහන්ස ... සෝවාන් ඵලයට පැමිණියා වූ ඔබ වහන්සේ ... දිවාගුහාවට, බොල්තුඹයට ආරූඪ වූ සබරගමුව හිම මාළිගාවට මහියංගන මහා මූලස්ථානයේ ජීවමානව වැඩ වාසය කරන්නා වූ ..." යනුවෙන් සමන් දෙවිඳුන්ට කෙරෙන යාතිකාවල දී කියවෙන ආකාරයට නම් එම දෙවිඳුන්ගේ මූලස්ථානය මහියංගණ-අලුත්නුවර ඓතිහාසික මහ සමන් දේවාලය යි.

මහියංගණය ලංකාවේ විශාලතම ගංගාව වන මහවැලි නදියට යාබද තැනිතලා භූමියක පිහිටි නගරයකි. මහියංගණය යන්න තැනිතලා බිමක් හැඳින්වීම උදෙසා යෙදූ පාලි නාමයක් බව කියැවෙන අතර මේ ප්‍රදේශය හැඳින්වීම සඳහා යෙදෙන සිංහල නම වන බිම්තැන්න යන්නේ අරුත ද තැනිතලාව යන්න යි. ඓතිහාසික වංශකතාවලට අනුව, බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදු වූ අවස්ථාවේ දී ධර්මය දේශනා කළේ යැයි කියැවෙන මහියංගණයේ මහානාග වනෝද්‍යානයේ ඓතිහාසික මහියංගණ ස්තූපය අසල ඉහත යාතිකාවේ කියැවෙන

සමන් දෙවිඳුන්ගේ මූලස්ථානය හෙවත් මහියංගණ-අලුත්නුවර ඓතිහාසික මහ සමන් දේවාලය පිහිටා ඇත. පැරණි දේවාලය සහ අලුත් දේවාලය යනුවෙන් දේවාල දෙකක් මෙහි ඇති අතර අලුත් දේවාලය ගොඩනගා ඇත්තේ පැරණි දේවාලය ආසන්නයේ ය. කෙසේ වෙතත් තවමත් බොහෝ බැතිමතුන් සිය පුද පූජා කටයුතු පවත්වන්නේ පැරණි දේවාල පරිශ්‍රයේ ය. මහියංගණයට බුදුරජාණන් වහන්සේගේ පැමිණීම සහ එම අවස්ථාවට සමන් දෙවියන් පැමිණ සිටීම පිළිබඳ කියැවෙන ඓතිහාසික වංශකතාවල මේ දේවාලය පිළිබඳව සඳහන් කර නැත. එබැවින් දේවාලයේ පෞරාණිකත්වය පිළිබඳ නිගමනයකට එළඹීම අපහසු ය.ගෘහ නිර්මාණ ශිල්ප ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පවා දේවාලයේ පෞරාණිකත්වය පිළිබඳ නිගමනයකට එළඹීම අපහසු වන්නේ ගොඩනැගිලි වරින් වර ප්‍රතිසංස්කරණයට භාජනය වී ඇති නිසා ය.

මහියංගණ-අලුත්නුවර ඓතිහාසික මහ සමන් දේවාලය සහ එහි වසන සමන් දෙවිඳුන් පිළිබඳ කරන විග්‍රහයක දී එතරම් වැදගත් නොවන්නේ යැයි කෙනෙකුට සිතිය හැකි කාරණයක් නම්, එක් කලෙක දී ලංකාවේ විශාල ප්‍රදේශයක ව්‍යාප්ත ව සිටියේ වී නමුදු මේ වන විට මහියංගණය අවට ප්‍රදේශ කිහිපයකට සීමා-මායිම් කර ඇති සහ මෑතක සිට ආදිවාසීන් ලෙස විශේෂ සැලකිල්ලට ලක්වන වැදි ජනතාව යි. මහාවංසයට අනුව, වැද්දන් යනු ලංකා ශිෂ්ටාචාරය ආරම්භ වීම හා සම්බන්ධ ප්‍රාරම්භක පුරුෂයා ලෙස සැලකෙන විජය සහ මහියංගණයේ දී බුදුරජාණන් වහන්සේ විසින් දමනය කරනු ලැබ 'ගිරිදීප' නම් දිවයිනට පලවාහැරියේ යැයි කියන යක්ෂයන්ගේ වර්ගයට අයත් කුවේණිය අතර ඇති වූ සම්භෝගයෙන් බිහි වූ දරු දෙදෙනාගෙන් පැවත එන්නන් ය. බුද්ධ පරිනිර්වාණ දිනයේ දී මෙරටට ගොඩ බසින විජය, කුවේණියගේ සහයෝගය ඇති ව 'සිරිසවත්තු' නම් යක්ෂ පුරයේ සිටි කුවේණියගේ නෑයන් වූ යක්ෂයන් මරා දැම්මේ ය. අනතුරුව විජය සහ කුවේණිය අතර ඇති වන සම්භෝගයෙන් කුවේණිය දරු දෙදෙනකු ලැබුවාය. පසුව විජය, කුවේණිය සහ දරු දෙදෙනා පිටුවහල් කළ අතර ඇය සිය දරු දෙදෙනා ද කැටිව 'ලංකාපුර' නම් යක්ෂ පුරය වෙත යයි. දරුවන් බැහැර හිඳුවා පුරයට ඇතුළු වන කුවේණිය හඳුනා ගන්නා යක්ෂයන් ඇයට පහර දී මරා දැමුවේ සතුරු පක්ෂය ගෙන සිය වර්ගයා පාවා දුන් බවට චෝදනා එල්ල වූ හෙයිනි. දරු දෙදෙනාට අනුකම්පා කළ කුවේණියගේ මාමා කෙනෙකුගේ අනතුරු ඇඟවීම නිසා සමනොළ අඩවියට පලා ගිය කුවේණියගේ දරු දෙදෙනා අතර සිදු වූ සම්භෝගය හේතු කොට ගෙන දඩයම් කිරීමෙන් ජීවත් වන 'පුලින්දයෝ' හෙවත් 'වැද්දෝ' බිහි වෙති (මහාවංසය 1996: 41). මහියංගණයට ආසන්න දඹාන වැද්දන්ගේ දීර්ඝකාලීන වාසභූමියක් ලෙස සැලකේ. මේ ප්‍රදේශයේ වෙසෙන වැදි ජනතාව සහ තමන් ද වැද්දන්ගෙන් පැවත එන්නේ යැයි කියන මේ ප්‍රදේශයේ සිංහල ජනතාව අතර තිබෙන ජනශ්‍රැති සහ පුරාණෝක්තිවලට අනුව ඔවුන් සහ සමන් දෙවිඳුන් අතර ඇත්තේ ඉතා සමීප ඓතිහාසික සම්බන්ධතාවකි. මෙම ජනශ්‍රැති සහ පුරාණෝක්තිවලට අනුව වැද්දන්ගේ මාතෘ දෙවඟන

යැයි කියන 'මහ ලොකුවො' හෙවත් 'මහලොකු මැණියන්' නැතහොත් 'මහ කිරිඅම්මා' සමන් දෙවිඳුන්ගේ සහෝදරියකි. මහියංගණ-අලුත්නුවර ඓතිහාසික මහ සමන් දේවාලය සමන් දෙවිඳුගේ මූලස්ථානය යැයි කියුව ද එම ප්‍රදේශයේ දී එම දෙවිඳුන්ට වඩා බලවත් යැයි සැලකෙන්නේ මහලොකු මැණියන් ය. සාමකාමී කාරුණික දෙවියකු ලෙස සැලකෙන සමන් දෙවියන් සමග සංසන්දනය කිරීමේ දී මහලොකු මැණියන් සමන් දෙවියන්ට ද වඩා බලගතු යැයි ප්‍රදේශයේ ජනතාව විශ්වාස කරති. සමන් දෙවියන් වෙනුවෙන් කැප වූ වෙනත් දේවාල මහියංගණයේ තදාසන්න පෙදෙස්වල නොමැති නමුදු මහලොකු මැණියන් වෙනුවෙන් කැප කරන ලද දේවාල තලංගමුව, දෙහිගොල්ල, මකුළුගොල්ල, සේරාණ, වෙලම්පැල්ල යන මහියංගණයට ආසන්න ප්‍රදේශවල පිහිටා තිබේ.

## පර්යේෂණ අරමුණු සහ ගැටලුව

වැද්දන් සහ සමන් දෙවියන් අතර මෙන් ම එම දෙවිඳුන් සහ මහලොකු මැණියන් අතර ඇති සම්බන්ධය පිළිබඳ ව මහාවංසය ඇතුළු ඓතිහාසික වංශකතා කිසිවක් නොකියයි. එහෙත් වඩාත් විමර්ශනාත්මක ව සලකා බලන විට පෙනීයන්නේ මහියංගණයේ වැද්දන් සහ සිංහල ජනතාව අතර තවමත් ශේෂ ව පවත්නා ජනශ්‍රැති සහ පුරාණෝක්තිවලින් එම දෙවියන් පිළිබඳ ඓතිහාසික වංශකතාවල කෙරෙන විස්තරයට සහ ලංකාවේ ජනප්‍රිය විශ්වාස පද්ධතියේ දී කියවෙනවාට වඩා වෙනස් ආකාරයේ කතිකාවක් තිබෙන බව යි. ඒ අනුව, ලංකාවේ පූර්ව බෞද්ධ ඓතිහාසික යුගය පිළිබඳ විචිත්‍රවත් කතා ප්‍රවෘත්ති අඩංගු මහාවංසය ඇතුළු ඓතිහාසික වංශකතාවල දී නොකියවෙන, එහෙත් ඓතිහාසික වශයෙන් සිදු වූ අතිශයින් වැදගත් සමාජීය සහ දේශපාලනික ක්‍රියාවලියක නොකියවුණු පැතිකඩක් මේ ජනශ්‍රැති සහ පුරාණෝක්තිවලින් නිරූපණය වන බව අපගේ හැඟීම යි. මේ අනුව සමන් දෙවියන් පිළිබඳ ඓතිහාසික වංශකතා විසින් කරනු ලබන විස්තර සහ මහියංගණය ප්‍රදේශයේ ජනතාව අතර එම දෙවියන් පිළිබඳව ශේෂව ඇති ජනශ්‍රැති හා පුරාණෝක්ති සංසන්දනය කරමින් තවදුරටත් කරගෙන යන පර්යේෂණයකට අදාළ ව මේ වන විට එක්රැස් කර ඇති දත්ත පදනම් කරගෙන ලියැවෙන්නා වූ මේ ලිපියේ මූලික අරමුණ බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනය හා සම්බන්ධව සමන් දෙවියන්ගේ මහියංගණ භූමිකාව සම්බන්ධයෙන් ලංකාවේ ප්‍රාග් බෞද්ධ ඓතිහාසික යුගය පිළිබඳ මහාවංසය ඇතුළු ඓතිහාසික වංශකතාවල දී නොකියවෙන කතා පුවත හඳුනා ගැනීමයි. මහියංගණයේ ඓතිහාසික මහ සමන් දේවාලය ආශ්‍රිතව සිදු වන පුද-පූජා සහ යාතුකර්මවලින් පිළිබිඹු වන ඓතිහාසික දේශපාලනික සහ සමාජ-සංස්කෘතික ක්‍රියාවලිය හඳුනා ගැනීම තවත් අරමුණකි. එසේම, සමන් දෙවිඳුන් පිළිබඳ මහියංගණයේ ජනතාව අතර, විශේෂයෙන් ම අධිපතිවාදී ලේඛනවල 'ප්‍රාථමික' ජන කොටසක් ලෙස හඳුන්වා ඇති සහ 'නොදියුණු,' හා 'අශිෂ්ට' යන විශේෂණවලින් ජනප්‍රිය කතිකාවේ දී හඳුන්වන වැදි ප්‍රජාව අතර තිබෙන ජනශ්‍රැති සහ

පුරාණෝක්තවල සමාජ-මානව විද්‍යාත්මක වැදගත්කම උපුටා දැක්වීමත් මෙම පර්යේෂණ ලිපියේ අරමුණු අතර වේ.

ඉහත සඳහන් පර්යේෂණ අරමුණුවලට අදාළ ව මෙහි දී මූලික පර්යේෂණ ගැටලුව වන්නේ මහියංගණයේ දී සමන් දෙවිඳුන් පිළිබඳ කියැවෙන ජනශ්‍රැති සහ පුරාණෝක්තිවල වැදගත්කම කුමක් ද යන්න යි. එම මූලික පර්යේෂණ ගැටලුවට අදාළ ව, මහියංගණයේ වැද්දන් සහ සමන් දෙවිඳුන් අතර ඇති සම්බන්ධතාව කුමක් ද? බුදුරජාණන් වහන්සේගේ මහියංගණ ගමන සිහි වනු වස් උන් වහන්සේගේ කේශ ධාතු තැන්පත් කර තමන් ඉදි කළ ඉන්ද්‍රනීල චෛත්‍යය සහිත මහියංගණයේ දී සමන් දෙවියන් අවශේෂ දෙවියකු බවට පත් වෙද්දී එම දෙවිඳුන්ගේ සොයුරිය යැයි කියන මහලොකු මැණියන් බලවත් වී ඇත්තේ ඇයි යන පර්යේෂණ ප්‍රශ්න කේන්ද්‍ර කර ගෙන මෙම ලිපියේ ඉදිරි ගලා යාම සිදු වෙයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ඉහතින් සඳහන් පර්යේෂණ ගැටලුවලට අදාළ ඓතිහාසික සමාජීය සහ දේශපාලනික ක්‍රියාවලිය හා සම්බන්ධ පසුබිම මතු කර ගැනීම පිණිස සම්මුඛ සාකච්ඡා ඔස්සේ මහියංගණයේ ජන කණ්ඩායම් අතර දිගු කලක් තිස්සේ පැවත විත් ශේෂව පවතින ජනශ්‍රැති සහ පුරාණෝක්ති එක්රැස් කිරීමට සමගාමීව ද්විතීයික මූලාශ්‍රය ආශ්‍රිත ව තොරතුරු එක්රැස් කිරීම ආරම්භ කළේ 2017 වසරේ සිට ය. යොදා ගන්නා ලද්දේ සාම්ප්‍රදායික සමාජවිද්‍යාත්මක පර්යේෂණවල දී භාවිත කෙරෙන ක්‍රමවේදීය රටා ඉක්මවා යන ක්‍රමවේදීය ආකෘතියකි. ඒ අනුව, මහියංගණයේ ජනශ්‍රැති සහ පුරාණෝක්ති සමග මහාවංසය ඇතුළු වංශකතාවල සඳහන් ඓතිහාසික ප්‍රවෘත්ති සංසන්දනය කිරීම ඔස්සේ වැද්දන් සහ සමන් දෙවිඳුන් අතර ඇති සම්බන්ධය, මහියංගණයේ දී සමන් දෙවියන් අවශේෂ දෙවියකු බවට පත්වීම සහ එම දෙවිඳුන්ගේ සොයුරිය යැයි කියන මහලොකු මැණියන් බලවත් වීම හා සම්බන්ධ ඓතිහාසික, දේශපාලනික, සමාජ-සංස්කෘතික ක්‍රියාවලිය පරීක්ෂා කර ඇත්තේ මේ දෙආකාරයක මූලාශ්‍රය ආශ්‍රිත ව පවතින ප්‍රතිවිරෝධතා ඉස්මතු කරමින් ඒවායේ දී යටපත් වී ඇති අරුත් ගවේෂණය කිරීම අරමුණු කර ගනිමිනි. එහි දී අනුගමනය කරන ලද්දේ ඇමෙරිකානු සමාජවිද්‍යාඥයෙකු වන සී. රයිට් මිල්ස් (1959) පවසන ආකාරයේ පරිකල්පනාත්මක විශ්ලේෂණයකි.

**සාහිත්‍යයික විමර්ශනයː සමන් දෙවියන් පිළිබඳ ඉතිහාසය සහ විද්වත් මත**

ඓතිහාසික වංශකතාවල දී ලාංකේය බෞද්ධ දේව මණ්ඩලයේ ප්‍රමුඛ දෙවියකු බවට පත් කරන ලදු ව 'සුමන' යන්නට පර්යාය නාම සහිත ව 'සමන් බොක්සැල්,'[2] 'මහා සුමන,' 'යක්ඛ සුමන' යනාදි නම්වලින් ද හඳුන්වා ඇති සමන් දෙවියන්ගේ ප්‍රභවය පිළිබඳ ව ඉතිහාසයේ විවිධ යුගවල දී විවිධ අදහස් මතු වී තිබිණි. මහායානික බෞද්ධාගමේ බලපෑම ලැබීමත් සමග මහායානික 'සමන්තභද්‍ර' බෝධිසත්වයන් ජනප්‍රිය වීමට විකල්පයක් වශයෙන් මහා විහාරිකයන් විසින් දේශීය දෙවියකු වූ සමන් දිව්‍යරාජයා ජනප්‍රිය කරන්නට ඇතැ'යි චන්ද්‍රා වික්‍රමගමගේ (2006) අදහසක් ඉදිරිපත් කර ඇත. ජයවර්ධනපුර රාජධානි සමයෙන් පසු සමන් දෙවියන් රාමායනයේ කියවෙන 'රාම' කුමරුගේ සොයුරු 'ලක්‍ෂමන' යැයි මතයක් ද ඇති විය. සමන් දෙවියන් රාම සොහොයුරු ලක්‍ෂමන යැයි සවැනි පැරකුම්බා යුගයට අයත් සපරගමු මහ සමන් දේවාල සන්නසේ ද සඳහන් අතර එම අදහස වත්මන් රත්නපුර සමන් දේවාලයේ සමන් දෙවියන් වෙනුවෙන් කරන යාතිකාවේ දී පවා කියවේ. එසේ ම සමන් යනු 'උපුල්වන්' දෙවිඳුන්ගේ මලණුවන් ය යන විශ්වාසයක් ද ගොඩ නැගී තිබිණි (සාසනරතන හිමි, 1999; ධර්මදාස සහ තුන්දෙනිය, 1993; රත්නපාල, 1996, 1992). කෝට්ටේ යුගය වන විට මේ දෙවියන් ලක්දිව සතර වරම් දෙවිවරුන් අතුරෙන් කෙනෙකු ලෙස පිළිගෙන තිබිණි.[3]

19 වන සියවස වන විට සමන් දෙවියන්ගේ අනන්‍යතාව පිළිබඳ ව පුළුල් ශාස්ත්‍රීය කතිකාවක් ගොඩනැගී තිබිණි. එම කතිකාවට ඇතැම් විට ලංකාවෙන් පිටස්තර අය පවා දායක වූ බව පෙනේ. උදාහරණයක් ලෙස එඩ්වර්ඩ් උප්හම් (Edward Upham) 1829 දී The History and Doctrine of Buddhism යනුවෙන් ලියූ කෘතියේ දී බුදුරජාණන් වහන්සේගේ දෙවන ලංකාගමනය හා සම්බන්ධ ව මහාවංසයේ සඳහන් වන 'සමිද්ධි සුමන' දෙවියන් සහ සමන් දෙවියන් එක් අයෙකැ'යි සඳහන් කර ඇත (උපුටා ගැනීම Paranavithana, 1952).[4] වරම්

---

[2] "සිද්ධ කිහි රැළි සමන් බොක්සැල් විහීසණ සිව්වරම් රජ නිති" යනුවෙන් ආරම්භ වන වදන් කවි පොතේ එන කවියේ කිය වේ. බලන්නː *ගන දෙවි හැල්ල සහ වදන් කවි පොත* (සංස්ː තුම්බෝවිල ධම්මරතන හිමි). දෙහිවලː ශ්‍රීදේවී ප්‍රින්ටර්ස්

[3] මහත් තෙදැති පුල්වන් සුරිඳු මුල් කොට
දිමුත් සමන් බොක්සල් සුරිඳු නෙත් කොට
සවත් සුරිඳු විබිසණ ඇ සුරන් හට
පිරිත් කියා පින් දී සිත සතුටු කොට

හංස සංදේශයේ එන මෙම කවියට අනුව සමන් දෙවියන් එකල ලක්දිව සතර වරම් දෙවිවරුන් අතුරෙන් කෙනෙකු ලෙස පිළිගෙන තිබූ බව පෙනේ. බලන්නː *හංස සංදේශය* (සංස්ː සී. ඊ. ගොඩකුඹුර). කොළඹː සීමාසහිත ඇපොතිකරීස් සමාගම

[4] එඩ්වර්ඩ් උප්හම්ගේ මෙම අදහස මට කියවීමට ලැබුණේ සෙනරත් පරණවිතාන ලියූ The God of Adam's Peak (1952) කෘතියෙනි. උප්හම්ගේ The History and Doctrine of Buddhism කෘතිය සොයාගැනීමට නොහැකි වූ නිසා උපුටා ගැනීම පරණවිතාන ලෙස සඳහන් කර ඇත.

දෙවිවරුන් සතර දෙනා අතුරින් එක් අයකු වශයෙන් සමන් දෙවියන් නැගෙනහිරට අධිපති දෙවියා බව හෙන්රි පාකර් (Parker, 1909) සඳහන් කරයි. සෙනරත් පරණවිතාන මුල දී සමන් දෙවියන් යනු, සමන්තභද්‍ර මහායාන බෝධිසත්වයන් යැයි පිළිගත්ත ද (Paranavithana, 1928) පසු ව ඔහු එම අදහස බැහැර කළේ ය. එසේ ම සමන් දෙවියන් යනු රාමගේ සොහොයුරු ලක්ෂ්මනය යන අදහස ද ඔහු ප්‍රතික්ෂේප කරයි. The God of Adam's Peak යන මැයෙන් පරණවිතාන 1952 දී ලියූ කෘතියේ දී සමන් දෙවියන්ගේ අනන්‍යතාව පිළිබඳ මෙම මත ගොඩනැගුණු ආකාරය විශ්ලේෂණාත්මක ව පෙන්වා දෙමින් එම මත ප්‍රතික්ෂේප කර ඇත. එම කෘතියේ දී ද, එයින් අනතුරුව ලියූ වෙනත් ලේඛනවල දී ද පරණවිතාන සමන් යනු පුරාණ වෛදික දෙවියෙකු වන 'යම' යැයි සඳහන් කරන අතර එම මතය සනාථ කිරීම සඳහා පුරාවිද්‍යාත්මක සහ සාහිත්‍යයික මූලාශ්‍රය රැසක් උපයෝගී කර ගනී. පරණවිතානගේ එම මතය පහසුවෙන් ප්‍රතික්ෂේප කළ නොහැකි යැයි එස්. ජී සමරසිංහ (1992) සඳහන් කරයි. එහෙත් එම මතය ද විවාදාපන්න ය. තවත් විද්වතුන් ගණනාවක් මහාවංසය ඇතුළු වංශකතා පුවත් විශ්ලේෂණය කරමින් සමන් දෙවියන් බවට පත් වූයේ බුදුරදුන් ලක්දිවට වැඩම කළ අවස්ථාවේ මෙහි සිට, බුදුසරණ ගිය ජන ප්‍රධානියකු බව තහවුරු කිරීමට උත්සාහ ගෙන තිබේ (රත්නපාල, 1996, ධර්මදාස සහ තුන්දෙනිය, 1993; අදිකාරම්, 1963). එම අදහස එක්තරා ප්‍රමාණයකට නිවැරදි ය. එහෙත් අප ඉහතින් සඳහන් කළ ලංකාවේ පූර්ව බෞද්ධ ශිෂ්ටාචාරකරණ ක්‍රියාවලිය තුළ සිදු වූ, එහෙත් මහාවංසය ඇතුළු ඓතිහාසික වංශකතාවල දී නොකියවෙන, අතිශයින් වැදගත් සමාජීය සහ දේශපාලනික ක්‍රියාවලිය ආශ්‍රිත ව සමන් දෙවියන් ස්ථානගත කිරීම හෝ එවැනි ස්ථානගත කිරීමක් ඔස්සේ එම දෙවියන්ගේ අනන්‍යතාව සොයා යාමක් ඉහත උත්සාහයන් ආශ්‍රිත ව දැක ගත නොහැකි ය.

## මහියංගණයේ සමන් දෙවියෝ

මහියංගණය සහ ඒ අවට ප්‍රදේශවල ජනතාව අතර ඇති ජනශ්‍රැති සහ පුරාණෝක්තිවලට අනුව එම සමන් දෙවියන් යනු, අනෙකකු නොව ඔවුන්ගේ ආදිතමයෙකි. පුරාවිද්‍යාත්මක සහ සාහිත්‍යයික මූලාශ්‍රය ඔස්සේ සමන් දෙවියන්ගේ සම්භවය සොයා යාමට උත්සාහ කළ විද්වතුන් මෙම ජනශ්‍රැති සහ පුරාණෝක්ති කෙරෙහි වඩාත් ගැඹුරින් අවධානය යොමු කළේ නම්, එම දෙවියන් පිළිබඳ ඔවුන්ගේ මතවාද වෙනස් වන්නට ඉඩ තිබුණි. විශේෂයෙන් ම දීර්ඝ කාලයක් තිස්සේ ථේරවාද මෙන් ම මහායාන බෞද්ධ සම්ප්‍රදායේ සහ ඉන්දියානු සංස්කෘතික ප්‍රවාහයේ බලපෑමට හසු වූ රටේ උතුරුදිග තැනිතලාව, බටහිර ප්‍රදේශය සහ සබරගමු පෙදෙස්වල මෙන් නොව මහියංගණ ප්‍රදේශයේ ජනතාව අතර සමන් දෙවියන් පිළිබඳ විද්වත් මහා සම්ප්‍රදායේ කියැවෙන ප්‍රවාදවලට පිටස්තර ජනශ්‍රැති සහ පුරාණෝක්ති රැසක් අදට ද ඉතිරි ව තිබේ. එම ජනතාව අතර පැවති එවැනි ජනශ්‍රැති මූලාශ්‍රය කෙරේ විද්වතුන් අවධානය යොමු කළේ නම් සමන් දෙවියන්ගේ මේ දේශීය ප්‍රභවය පමණක් නොව බුදුරජාණන් වහන්සේ ලංකාවට පැමිණීම සහ මහියංගණයේ දී යක්ෂයන් දමනය කොට

වසර පන්දහසක් බුදුදහම ආරක්ෂා වන භූමිය පූජනීයත්වයට පත් කිරීම හා සම්බන්ධ කතා පුවතට අමතරව පුරාණ ලංකාවේ සිදු වූ අතිශයින් ම වැදගත් දේශපාලනික සහ සංස්කෘතික වෙනස්වීම් ග්‍රහණය කර ගන්නට ද ඔවුන්ට හැකි වන්නට තිබුණි. සමහර විට ඔවුන්ට එම ජනශ්‍රැති සහ පුරාණෝක්ති පිළිබඳ ව අසන්නට ලැබුණ ද ඒවා කෙරෙහි එතරම් අවධානයක් යොමු නොකරන්නට ඇත. සමන් දෙවියන් පිළිබඳ බෙහෙවින් විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කළ සෙනරත් පරණවිතාන The God of Adam's Peak යන සිය කෘතියේ දී මහියංගණ-අලුත්නුවර සමන් දේවාලයේ පිදුම් ලබන සමන් දෙවියන්ගේ සහෝදරිය යැයි සැලකෙන මහලොකු මැණියන් පිළිබඳ සිය නිරීක්ෂණ මෙසේ සඳහන් කර ඇතඃ "...මහලොකු අක්කා නමින් හැඳින්වෙන දේවතාවිය සමන් දෙවියන්ගේ වැඩිමහල් සොහොයුරිය යි. මේ දේවාලයේ දී වෙනත් දේවතාවියකට වැඳුම් පිදුම් නොකෙරේ. මා දන්නා තරමින් තමාගේ සහෝදරිය සමග එකට වැඳුම් පිදුම් ලබන දෙවියකු සිටින ලංකාවේ තිබෙන එක ම දේවාලය ද මෙය යි" (Paranavithana, 1952). මේ විස්තරය හැර පරණවිතානට මහියංගණයේ සාමාන්‍ය ජනයා අතර මහලොකු මැණියන් සහ සමන් දෙවියන් අතර සම්බන්ධය පිළිබඳ පැවති තවත් ජනශ්‍රැති සහ පුරාණෝක්ති ශ්‍රවණය කිරීමට ලැබෙන්නට ඇතත් සිය විශ්ලේෂණවල දී සාහිත්‍යයික සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය කෙරේ වැඩි අවධානයක් යොමු කළ නිසා දෝ එම ජනශ්‍රැති සහ පුරාණෝක්ති කෙරේ ඔහු එතරම් අවධානයක් යොමු කළ බවක් පෙනෙන්නට නැත. එම ජනශ්‍රැති සහ පුරාණෝක්ති කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබුයේ ලංකාවේ මුල් ම පදිංචිකරුවන් හෙවත් ආදිවාසීන් යැයි සැලකෙන වැදි ජනතාව පිළිබඳ විසම්මුතික කියැවීමක යෙදුණු ගණනාථ ඔබේසේකර විසිනි (2002b, 2002c).[5]

ඔබේසේකර වැදි ජනතාවගේ ප්‍රාථමිකත්වය පිළිබඳ ව ලියූ සිය ලේඛනවල දී පෙන්වා දෙන පරිදි, මහියංගණ-මහඔය ප්‍රදේශයේ වැද්දන් ප්‍රකාශ කරන්නේ ශ්‍රේෂ්ඨ දෙවියකු වන සමන් දෙවියන් මෝඩ ලෙස බුදුරජාණන් වහන්සේට ලංකාවට වඩින ලෙස ඇරයුම් කිරීමට පෙර, ඔහු තමන්ගේ ම මුතුන් මිත්තකු වී සිටි බවයි. සමන් දෙවියන් යනු, ඔවුන්මාතෘ දෙවඟන සේ සලකන මහ ලොකුවෝ නැතහොත් මහ කිරිඅම්මාගේ බාල සොහොයුරෙකි. එහෙත් ඔහු සිංහලයන්ගේ ද ප්‍රධාන පෙළේ දෙවියෙකි (ඔබේසේකර, 2018bඃ 267). තමන් පැවත එන්නේ වැදි ජනතාවගෙන් බව පවසන මහියංගණය සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල වර්තමානයේ

5 මෙම ලිපියට අදාළ ව අප විසින් පරිශීලනය කරන ලද ගණනාථ ඔබේසේකරගේ 2018a, 2018b, 2018c යන ලේඛන මුලින් ම පළ වී ඇත්තේ පිළිවෙළින් 1984, 2002 සහ 2004 වසරවල දී ඉංග්‍රීසි බසිනි. එම ලේඛන සිංහල බසට පරිවර්තනය කරන ලදු ව 2018 වසරේ දී *"ගණනාථගේ රචනාඃ ගණනාත් ඔබේසේකර විසින් රචිත ලිපි දොළොසක සිංහල පරිවර්තනය"* යන මැයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨ පර්යේෂණ මධ්‍යස්ථානය විසින් පළ කරන ලද ප්‍රකාශනයේ පළ විය. මෙහි දී පරිශීලනය කර ඇත්තේ ඔබේසේකරගේ ලිපිවල එම සිංහල පරිවර්තන යි.

සිංහල යැයි හඳුන්වා ගන්නා ජනතාව විශ්වාස කරන්නේ ද සමන් දෙවියන් යනු වැදි ජනතාවගේ ආදිතමයකු බවයි. මහියංගණ-අලුත්නුවර සමන් දේවාලයේ ප්‍රධාන කපු මහතා වන මද්දුමබණ්ඩා මහතා සහ එම දේවාලයේ තවත් කපු මහතකු වන ලයනල් බණ්ඩාර යන දෙදෙනාම ප්‍රකාශ කරන්නේ අමුඩ නොගසන නමුදු තමන් ද වැද්දන් බවත්, සමන් දෙවියන් ද වැද්දන්ගෙන් පැවත එන තමන්ගේ ම කෙනෙකු බවත් ය.

සමන් දෙවියන් සමග තමන්ට ඇති සම්බන්ධය පිළිබඳ කියන මහියංගණ-මහඔය ප්‍රදේශයේ වැද්දන්ගේ ප්‍රකාශයෙන් තවත් ඉතා වැදගත් ප්‍රවාදයක් මතු වේ. එනම්, ශ්‍රේෂ්ඨ දෙවියකු වන සමන් දෙවියෝ බුදුරජාණන් වහන්සේට ලංකාවට වඩින ලෙස ඇරයුම් කළෝ ය යන ප්‍රවාදය යි. මේ ප්‍රකාශය කරන්නේ මහියංගණ-මහඔය ප්‍රදේශයේ වැද්දන් පමණක් නොවේ. වර්තමානයේ සිංහල යැයි හඳුන්වන මහියංගණ ප්‍රදේශයේ පාරම්පරික ජනතාව බුදුරජාණන් වහන්සේ මහියංගණයට පැමිණීම පිළිබඳ ව දරන මතය ද වැද්දන්ගේ ප්‍රකාශයට සමාන ය. අමුඩ නොගසන නමුදු තමන් ද වැද්දන්ගෙන් පැවත එන්නේ යැයි කියන මද්දුමබණ්ඩා කපු මහතාට අනුව බුදුරජාණන් වහන්සේ මහියංගණයට පැමිණියේ සමන් දෙවිඳුන්ගේ ඇරයුමෙනි. එම ඇරයුම පිළිබඳ ඔහුගේ අදහස වැද්දන්ගේ අදහසට වඩා විස්තරාත්මක ය. ඔහුට අනුව සමන් දෙවිඳුන් බුදුරජාණන් වහන්සේට මහියංගණයට වඩින ලෙස ඇරයුම් කළේ මහියංගණ ප්‍රදේශයේ සිටි යක්ෂ ගෝත්‍රික කණ්ඩායම් දෙකක් අතර ඇති වූ ගැටුමක් සංසිඳුවීමට ය.[6] මද්දුමබණ්ඩාගේ මේ ප්‍රකාශය බුදුරජාණන් වහන්සේගේ දෙවන ලංකාගමනයට අදාළ ඓතිහාසික වංශකතා විස්තරකරනයට, එනම් නාගදීපයේ නා රජවරුන් දෙදෙනෙකු අතර මැණික් පුටුවක් අරභයා ඇති වූ සටන සංසිඳුවීමට කැලණියේ 'මණිඅක්ඛික' නා රජුගේ ඇරයුමෙන් බුදුරජාණන් වහන්සේ දෙවන වරට ලංකාවට පැමිණියහ යන්නට යම් සමානත්වයක් තිබේ. එසේ ම එමගින් බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනය පිළිබඳ ඓතිහාසික වංශකතා විස්තරය සහ ඒ අනුව ලංකාවේ ගොඩනැගී ඇති ජනප්‍රිය පිළිගැනීම අභියෝගයට ලක් වේ. බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩම කිරීම හා යක්ෂයන් දමනය කිරීම පිළිබඳ මහියංගණයේ ජනතාව අතර පවතින ප්‍රවාදය ඒ පිළිබඳව විචිත්‍රවත් මහාවංස කතා ප්‍රවෘත්තියට සහ එය පදනම් කර ගෙන පසු ව ලියවුණු ඓතිහාසික ලේඛනවල[7] සඳහන් ව ඇති අතිශයෝක්ති සහගත විස්තරකරණයට වඩා තරමක් වෙනස් ය. මහියංගණ-අලුත්නුවර සමන් දේවාලයේ ප්‍රධාන කපු මහතා වන මද්දුමබණ්ඩා විසින් බුදුරජාණන් වහන්සේ මහියංගනයට වැඩම කිරීමෙන් පසු ව සිදු වූ දේවල් පිළිබඳ ව විස්තර කරන ලද්දේ පහත ආකාරයට ය;

---

[6] මද්දුමබණ්ඩා කපු මහතාට අනුව මේ ගැටුම ඇති වී තිබෙන්නේ මහියංගණයට ආසන්න ව පිහිටා ඇති 'යහන්ගල' සහ 'කොඩියබැන්දගල' නම් ප්‍රදේශ දෙකක ස්ථානගත ව සිටි යක්ෂ ගෝත්‍රික කණ්ඩායම් දෙකක් අතර ය.

[7] බලන්න *පූජාවලී* පිටු 482-3 (සංස්: ඒ. වී. සුරවීර ඇතුළු අය) (1998) කොළඹ: ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

> බුදුරජාණන් වහන්සේ පෑ ප්‍රාතිහාර්යය නිසා යක්ෂයෝ දැවෙන්නටත්, වෙවුලන්නටත් වූහ. විකාරයෙන් දොඩමින් සී සී කඩ දුවන්නටත් වූ අතර පත්ව ඇති අසීරුතාව තම ගැලවුම්කරුවා වූ සමන් දෙවිඳුන්ට දන්වා සිය ජීවිත බේරා දෙන්නැයි ඉල්ලූහ. එහෙත් එම ඉල්ලීමට සමන් දෙවිඳුන් සිනහ වූවා පමණි. දුකට පත් මොහොතේ දී තම නායකයා තමන්ට සිනාසීම පිළිබඳව කිපුණු යක්ෂයෝ සමන් දෙවිඳුන්ට දුනු ඊතලවලින් විදින්නටත්, රිටිවලින් පහර දෙන්නටත් වූහ. ඒ කිසිවකින් සමන් දෙවිඳුන්ට උපද්‍රවයක් නොවීය. මේ මොහොතේ තම සොහොයුරා බේරා ගන්නේ 'මහලොකු මැණියන්' විසිනි. මේ සියල්ල දර්ශනය කළ බුදුරජාණන් වහන්සේ යක්ෂ ගෝත්‍රික පිරිස දමනය කොට පලවා හැරියහ. දැඩි සේ සිරුර ගිනි ගෙන දැවෙන්නට පටන් ගත් බැවින් මෙම පිරිස අසල ඇති මහවැලි ගඟට පැන එතෙර වී පලා ගියහ. ඔවුන් යළි නැවතුණු තැන හුන්නස්ගිරි කන්දයි.

ලාංකේය පූර්ව බෞද්ධ ඉතිහාසය පිළිබඳ ව මහාවංසය ඇතුළු ඓතිහාසික වංශකතාවල කියැවෙන විචිත්‍රවත් විස්තරකථන සමග සංසන්දනය කිරීමේ දී එම වංශකතාවල නොකියවෙන එහෙත්, මහියංගණය ප්‍රදේශයේ ජනතාව අතර තවමත් පවතින මේ ජනශ්‍රැතිවල කියැවෙන සිත් ඇදගන්නා සුලු කාරණා ගණනාවක් තිබේ: එදා මහියංගණයට රැස් ව සිටි යක්ෂයෝ සිය ගැලවුම්කරුවා ලෙස සමන් දෙවියන් සැලකූහ. බුදුරජාණන් වහන්සේගේ ප්‍රාතිහාර්යය නිසා පීඩාවට පත් යක්ෂයන්ගේ පිහිටට සමන් දෙවියන් නොපැමිණීම නිසා සිය ගැලවුම්කරුවා කෙරෙහි කෝපයට පත් වන යක්ෂයෝ ඔහුට පහර දෙති. අවසානයේ දී බුදුරජාණන් වහන්සේගේ ප්‍රාතිහාර්යයෙන් පීඩාවට පත් ව සිය ගැලවුම්කරුවාගෙන් ද පිහිටක් නොලැබ ඔවුහූ පලා යති. ජනප්‍රවාදයට අනුව ඔවුන් පලායන්නේ මහියංගණයෙන් තරමක් ඔබ්බෙහි පිහිටි හුන්නස්ගිරි කන්දට ය. මහියංගණයට බුදුරජාණන් වහන්සේගේ පැමිණීමත්, එහි දී යක්ෂයන්ගේ සහ සමන් දෙවියන්ගේ ක්‍රියාකාරීත්වයත් පිළිබඳ ව ඓතිහාසික වංශකතාවල දී සහ මහියංගණයේ ජනශ්‍රැති සහ පුරාණෝක්තිවල දී කියවෙන එකිනෙකට වෙනස් මෙම කතිකා දෙකට අදාළ ව සැබවින් ම සිදු ව ඇත්තේ කුමක් ද? මේ කතිකා දෙකට යටින් සැඟ ව ඇති සැබවින් ම සිදුවන්නට ඇතැ'යි සිතිය හැකි දෙය කුමක් දැ'යි අනාවරණය කර ගැනීමේ දී ලංකාව යැයි හඳුන්වන භූමියට ආසන්න වෙනත් භූමි ප්‍රදේශවලින් ජන කණ්ඩායම් පැමිණීම සහ ඔවුන් තමන්ට ආගන්තුක වූ භූමියක ස්ථාපිත වීමට උත්සාහ කිරීමේ ක්‍රියාවලිය ආශ්‍රිත ව සැබවින් ම සිදු වූයේ කුමක් දැ'යි විශ්ලේෂණය කිරීමට සිදු වේ. මේ ක්‍රියාවලිය ජන කණ්ඩායමක් නව භූමි ප්‍රදේශයකට පැමිණ ජනාවාස පිහිටුවා ගැනීමේ අර්ථයෙන් පමණක් නොව එම නව භූමි ප්‍රදේශය බලවත් සංස්කෘතියකට නිරාවරණය වීම යන අර්ථයෙන් ද සලකා බැලිය යුතු ය.

## ලංකාවට ජන කණ්ඩායම් පැමිණීම සහ ජනාවාස පිහිටුවා ගැනීමේ ඉතිහාසය

මහාවංසය ඇතුළු ඓතිහාසික වංශකතාවලට අනුව, ලංකාවේ මනුෂ්‍ය ශිෂ්ටාචාරය ආරම්භ වන්නේ විජය ඇතුළු සත් සියයක පිරිසක් ලංකාවට පැමිණීමත් සමග ය. එම වංශකතාවල කියවෙන ආකාරයට, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ දිනයේ දී විජය ඇතුළු පිරිස ලංකාවට ගොඩබසිති. විජය ඇතුළු පිරිසේ ආරක්ෂාව සඳහා කටයුතු සැලසීම බුදුරජාණන් වහන්සේ ශක්‍රයාට පවරන්නේ බුදු සසුන වසර පන්දහසක් කල් පවතින්නේ ලංකාද්වීපයේ යැයි දිවැසින් දුටු හෙයිනි. ශක්‍රයා ඒ කාර්යය උපුල්වන් දෙවිඳුන්ට පවරයි. විජය ඇතුළු පිරිස මෙරටට ගොඩබට අවස්ථාවේ දී පරිබ්‍රාජක වෙසින් සිටි උපුල්වන් දෙවිඳුන් මුණගැසේ. ඔහුගෙන් මේ කවර දිවයිනක් දැ'යි අසන විජයට ලැබෙන පිළිතුර මේ ලක්දිව බවත් මෙහි මිනිසුන් නොමැති බවත් ය. අනතුරුව තම්බපණ්ණියට ගොඩබසින විජයට යක්ෂ ස්ත්‍රියක වන කුවේණිය හමු වෙයි. මේ හමුවීම පිළිබඳ මහාවංසයේ සඳහන් විචිත්‍රවත් විස්තරයේ යක්ෂ නමැති අමනුෂ්‍ය කොට්ඨාසය සතු අසාමාන්‍ය හැකියාවන් පිළිබඳ අදහසක් ගැබ් වේ: කුවේණියගේ සේවිකාවක් බැල්ලකගේ වෙස් ගෙන විජයගේ පිරිස නොමග යවයි. කුවේණිය විජයගේ සත්සියයක් පිරිස අතුරුදහන් කරයි. එහෙත් යක්ෂණියකට රැවටිය නොහැකි වූ විජය, කුවේණිය බියගන්වා දමනය කර ඇයගේ සහායෙන් 'සිරිසවත්තු' නම් පුරවරයක සිටි යක්ෂයන් සමූලඝාතනය කර 'තාම්‍රපර්ණියට' ගොස් එහි නුවරක් තනාගෙන වාසය කළේ ය. විජයගේ සහචරයන් ද ජනාවාස පිහිටුවන ලද්දේ යැයි මහාවංසය කියයි.

ලංකාව වෙත පැමිණි මේ සංක්‍රමණික ප්‍රජාවන්ගේ ක්‍රියා කලාපය අවබෝධ කර ගැනීමේ දී ලෝක ඉතිහාසයේ නව ජානපදිකයන් වෙනත් ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගැනීමට ගිය විට ඒ ඒ ප්‍රදේශවල වාසය කළ ස්වදේශික ජනයා කෙරේ දක්වා ඇති ප්‍රතිචාර කෙරෙහි මෙහි දී අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත. ලෝක ඉතිහාසයේ දී බලවත් ජන කණ්ඩායම් වෙනත් ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගැනීමට ගිය විට ඒ ප්‍රදේශවල වාසය කළ ස්වදේශික ජනයා කෙරේ දක්වා ඇත්තේ එතරම් යහපත් ප්‍රතිචාර නොවේ. අප ඉතාමත් හොඳින් දන්නා මෑතකාලීන ඉතිහාසය තුළ ඇමෙරිකා මහාද්වීපයට සහ ඔස්ට්‍රේලියාවට පැමිණි යුරෝපීය ජානපදිකයන් විසින් ස්වදේශීය ජනයා ඔවුන් පදිංචි ව සිටි ප්‍රදේශවලින් එලවා දැමීම හෝ දහස් ගණනින් ඝාතනය කිරීම මෙන් ම 'පහත් වර්ගයක්' ලෙස අවඥාවට ලක් කිරීම ද සිදු කර ඇත.[8] ඉන්දියාව තුළ ආර්යයන් ව්‍යාප්ත වීමේ ක්‍රියාවලියේ දී ඔවුන් තමන්ට අභිමුඛ වූ

[8] 1830 දී ස්වදේශික රතු ඉන්දියානුවන් 125,000ක් ජෝර්ජියා, ටෙනසි, ඇලබාමා, උතුරු කැරොලිනා සහ ෆ්ලොරිඩා යන වත්මන් ඇමෙරිකානු නිරිතදිග ප්‍රාන්ත පිහිටි ප්‍රදේශවල ජීවත් වූහ. ස්වකීය මුතුන් මිත්තන් පරම්පරාගත ව ජීවත් වූ භූමියේ වාසය කළ ඔවුන් අතරින් එම දශකය අවසානයේ දී ඉතා සුළු ප්‍රමාණයක් පමණක් ඉතිරි වූයේ සුදු ඇමෙරිකානුවන්ගේ කපු වගාවට ඉඩම් ලබා ගැනීම පිණිස එම ප්‍රදේශවලින් ඉවත් ව සැතපුම් සිය ගණනක් ඔබ්බෙහි මිසිසිපි නදියට එපිට "ඉන්දියානු භූමි ප්‍රදේශය" ලෙස වෙන් කළ ප්‍රදේශයකට යාමට ඇමෙරිකානු ෆෙඩරල් ආණ්ඩුව ඔවුන්ට බල කළ බැවිනි. ෆෙඩරල් හමුදාවේ බලහත්කාරය යටතේ කැස්ස, උණ, පාචනය, කොලරාව සහ සාගින්න සමග Trail of Tears යනුවෙන් හඳුන්වන සැතපුම් 1200කට ආසන්න ඉතා දුෂ්කර, මාරාන්තික මේ ගමන අවසන් වන විට ඔවුන් අතරින් විශාල පිරිසක් මිය ගියහ.

දඩයම් කිරීමෙන් සහ ආහාර රැස් කිරීමේ නියැළුණු ජනයා (Hunter gatherers) විනාශ කිරීමේ යෙදුණු බවත් එම පිරිස රාක්ෂයන් ලෙස නම් කළ බවත් පවසන රොමිලා තාපර් (2002) උපුටා දක්වන නිර්මාල් රන්ජිත් දේවසිරි ලංකාවේ වංශකතාවල එන යක්ෂයන් පිළිබඳ තොරතුරු තේරුම් ගත යුත්තේ ද ඒ ආකාරයට බව යෝජනා කරයි (දේවසිරි, 2019: 39-40). මෙම ලිපියේ දී අප මතු කළ මූලික පර්යේෂණ ගැටලුවලට පිළිතුරු සපයා ගැනීමට සිදු වන්නේ ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ දී සිදු වූ මේ පුළුල් සමාජ ක්‍රියාවලිය විශ්ලේෂණය කිරීමෙනි.

වංශකතාකරුවන්ට අනුව විජය ඇතුළු පිරිස මෙරටට ගොඩබට අවස්ථාවේ දී ඔවුන්ට මුණගැසුණු පරිබ්‍රාජක වෙසින් සිටි උපුල්වන් දෙවිඳුන් ලක්දිව මිනිසුන් නොමැති බව පැවසුව ද බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනය, යක්ෂයන් දමනය කිරීම සහ සමන් දෙවියන් බුදුන් සරණ යාම පිළිබඳ මහාවංස විස්තරයේ දී ලංකාවේ මුල් පදිංචිකරුවන් දෙකොටසක් ගැන කියවෙයි; එනම්, යක්ෂයන් සහ නාගයන් ය. නාගයන් පිළිබඳ බුදුජාණන් වහන්සේ ලංකාවට වැඩම කළ බව පැවසෙන අවස්ථා තුනේ දී ම සඳහන් වේ. කැලණියේ මණිඅක්ඛික නා රජු උන්වහන්සේ මහියංගණයට වැඩම කළ අවස්ථාවේ සරණ සීලයෙහි පිහිටා සිටියේ යැයි කියැ වේ. නාග ගෝත්‍රිකයන් වෙළඳ කටයුතු හා සම්බන්ධ වූ ජන කොටසක් යැයි සිතිය හැක්කේ වංශකතාවල සඳහන් විස්තරවලට අනුව කැලණිය, නාගදීපය, මහියංගණය යනාදී ඔවුන්ගේ ජනාවාස බොහෝ විට වෙරළාසන්න ව සහ ගංගා තොටුපලවල් ආසන්න ව පිහිටා තිබූ බව හැඟෙන නිසාය.[9] ඉන්දියාවේ දී බුදුරදුන් ජීවමාන ව සිටි කාලයේ වෙළඳ ප්‍රජාව බුදුදහම පිළිගෙන ඊට අනුග්‍රහය දැක්වූ ආකාරයට ම ලංකාවේ දී මේ නාග ගෝත්‍රික වෙළඳ ප්‍රජාව බුදු දහමට අනුග්‍රහය දක්වන්නට ඇතැ’යි සිතිය හැකි ය.[10] ලංකාවේ සිටි යක්ෂ, නාග කොටස් අතරින් ඓතිහාසික වංශකතාවලට අනුව විජය ඇතුළු පිරිස නාගයන් සමග එතරම් බරපතළ ගැටුමක් ඇති කර ගත් බවක් පෙනෙන්නට නැත. නාගයන් යනු වෙළෙන්දන් ය යන අපගේ උපකල්පනය සමග සමගාමී කළහොත් විජය ඇතුළු පිරිසට නාගයන් සමග ගැටුමක් ඇති නොවිය හැකි තත්ත්වය වන්නේ නව සංක්‍රමණිකයන් කෘෂිකාර්මිකයන් සහ ගව පාලනයේ යෙදුණවුන් නිසා මේ දෙකොටස අතර වෘත්තීයමය වශයෙන් ගැටුමක් නැති

https://www.history.com/topics/native-american-history/trail-of-tears Accessed date 08.11.2021

[9] මහාවංසයේ බුදුජාණන් වහන්සේ ලංකාවට වැඩම වීම පිළිබඳ කියවෙන කොටස් බලන්න

[10] ඉන්දියාවේ දී බුදුදහම, ජෛනාගම වැනි ශ්‍රමණ සම්ප්‍රදායේ ආගම් ප්‍රචාරය වූයේ වෙළඳුන් මාර්ගයෙනි. බුද්ධ, ධම්ම සරණ ගිය උතුරු දනව්වේ සිට පැමිණිය බව කියැවෙන තපස්සු-භල්ලුක වෙළඳ දෙබෑයන් ඔවුන් ලද කේශ ධාතු රැගෙන ශ්‍රී ලංකාද්වීපයට විත් ගිරිහඬු නම් වෙහෙරක් කර වූ බව පූජාවලිය (1998: 140-41) කියයි.

බැවිනි. කෙසේ වෙතත්, බුදුරජාණනන් වහන්සේගේ ලංකාගමන අවස්ථා තුනෙන් පසුව මහාවංසය ඇතුළු වංශකතා නාගයන් පිළිබඳ ව සඳහන් නොකරයි.[11]

කෙසේ වෙතත්, වංශකතාවල දී රෞද්‍ර වූ ද අශිෂ්ට වූ ද පිරිසක් යැයි හඳුන්වා දී ඇති යක්‍ෂයන් සහ මූලික වශයෙන් ස්ථාපිත කෘෂිකර්මාන්තය හෙවත් ඔත් ගොවිතැනෙහි නිරත වූ සහ ගව පාලනයේ ද යෙදුණේ යැයි සිතිය හැකි නව සංක්‍රමණිකයන් අතර ඇති වූ ගනුදෙනුව කුමක් විය හැකි ද? එම ගනුදෙනුව අනිවාර්යයෙන් ම නාගයන් සමග කළ ගනුදෙනුවට මුළුමනින් ම වෙනස් වන්නට ඇත්තේ වංශකතා සැම විට ම රෞද්‍ර සහ අශිෂ්ට යන විශේෂණවලින්හඳුන්වන යක්‍ෂයන් යැයි සඳහන් කෙරෙන පිරිස අතර කැලෑ, කඳු, හෙල් ඇසුරු කොට ගෙන දඩයමින් සහ ආහාර ද්‍රව්‍ය එක්රැස් කිරීම හා යම් ආකාරයක වගා කටයුතුවලින් ද ජීවත් වූ ජන කොටස් සිටින්නට ඇති බැවිනි (උදා. විජය පැමිණෙන විට කුවේණිය කපු කැටීම). මේ අනුව ස්වකීය ජීවනෝපාය සඳහා සංක්‍රමණිකයන්ට මෙන් ම යක්‍ෂයන්ට ද භූමිය වැදගත් වූ බැවින් නව සංක්‍රමණිකයන්ගේ පැමිණීමට සහ ස්ථාපිත වීමට එරෙහි ව ඍජු විරෝධයක් ඔවුන් වෙතින් එල්ල වීම අනිවාර්යයෙන් ම සිදුවිය හැකි දෙයකි. කෙසේ වෙතත්, ඇමෙරිකානු භූමිය ඇතුළු ලෝකයේ වෙනත් පෙදෙස්වල යුරෝපීය ජනපදකරණ ක්‍රියාවලියේ දී සහ භාරතයට ආර්යයන් පැමිණීමේ දී සිදු වූ ආකාරයට ම නව සංක්‍රමණිකයන් හා තරග කළ නොහැකි වූ හුදෙක් දඩයම සහ ආහාර එක්රැස් කිරීමෙන් යැපුණු ජනතාවගේ ඉරණම තීරණය වන්නට ඇත. නව සංක්‍රමණිකයන්ගේ ස්ථාපිත වීමට අභ්‍යන්තර සහයෝගය ද තිබෙන්නට ඇති අතර අප පෙර සඳහන් කළ ආකාරයට නව ජානපදිකයන් වෙනත් ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගැනීම සඳහා කටයුතු කළ බොහෝ අවස්ථාවල අනුගමනය කළ ඝාතනය කිරීමේ සම්ප්‍රදාය මෙරටදී ද ක්‍රියාවට නැංවී ඇති බව පෙනෙන්නේ විජය-කුවේණි පුරාණෝක්තියේ කියවෙන ආකාරයට කුවේණියගේ සහයෝගය ඇති ව විජය විසින් සිරිසවත්තු පුරයේ සිටි යක්‍ෂයන් සමූලඝාතනය කරන ලදැයි කියවෙන බැවිනි.

නව සංක්‍රමණිකයන් නව භූමි ප්‍රදේශය තුළ ස්ථාවර ජනාවාස පිහිටුවා ගෙන සිය පැවැත්ම තහවුරු කර ගන්නේ තමන් පැමිණි මුල් භූමි ප්‍රදේශ සමග සම්බන්ධතා ද පවත්වා ගනිමිනි.

[11] බුදුරජාණන් වහන්සේගේ ලංකාගමන සිදු වූ අවස්ථා තුනෙන් පසු ව ලංකා ඉතිහාසයේ යම් යම් අවස්ථාවල දී නාගයන් පිළිබඳ සඳහන් නැත්තේ ම නොවේ. දුටුගැමුණු රජු නාග කන්‍යාවක බිරිඳ කර ගත්තේ යැයි පැවසෙන අප්‍රකට ජනශ්‍රැතියක් ලංකා සමාජයේ තිබේ (බලන්න Robinson, 1968). එමෙන් ම සැළලිහිණි සන්දේශයේ දී රාහුල හිමි සැළලිහිණියාට කැලණි නදියේ ඉවුරු අසබඩ හිඳ බුදුගුණ ගයන නාග කන්‍යාවන් දැක ගන්නා ලෙස කියයි. බලන්න සැළලිහිණි සන්දේශයේ 45 පද්‍යය. (සංස්: පී. එස්. බී. සේනානායක). කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ

මනහර නා මෙනෙවිය හිඳ ලවැලි පිට
ගෙන මිණි වෙන නද නියගින් මැද රුවට
කනහෙව ගයන බුදුගුණ ගී මියුරු කොට
සැනහෙව කැලණි ගඟ බඩ මඳ කලක් සිට.

මේ අනුව සාමාන්‍යයෙන් සිදු වන පරිදි නව භූමි ප්‍රදේශය වෙත තව තවත් සංක්‍රමණ ද සිදු වන්නට ඇතැ'යි උපකල්පනය කළහොත්, දඩයක්කරුවන් සහ ආහාර එක්රැස් කරන්නන් වූ පැරණි පදිංචිකරුවන්ගේ ගොදුරු බිම් තවදුරටත් හැකිලීයාම අනිවාර්යයෙන් ම සිදුවිය හැකි සේ ම එම ක්‍රියාවලිය මේ දෙපිරිස අතර ප්‍රතිවිරෝධතා ඇති වීමට ද හේතු වීම ස්වාභාවික ය. සිය මුල් භූමි ප්‍රදේශවල සිදු වෙමින් පැවති වෙනස්කම්වලින් පෝෂණය වෙමින් සිටී නව පදිංචිකරුවන් ලේඛන කලාව ද ඇතුළු තාක්ෂණික ක්ෂේත්‍රවල දියුණුව ද අත් කර ගෙන සිටින්නට ඇත. විජය ඇතුළු පිරිසට තමන්ගේ මුල් භූමි ප්‍රදේශවල එවකට පැතිරෙමින් තිබූ බුදුසමය සම්බන්ධයෙන් කුමනාකාර ගනුදෙනුවක් පැවතුණේ ද යන්නට සාක්ෂි අපට නොමැත. එහෙත් දේවසිරි පෙන්වා දෙන පරිදි ක්‍රි. පූ. 3 වන සියවස වන විට බෞද්ධ භික්ෂූන් සහ බෞද්ධාගමික ප්‍රජාවක් දිවයිනේ බොහෝ ප්‍රදේශවල ව්‍යාප්ත ව සිටියහ (2019: 46). එනමුදු රාජ්‍යය බෞද්ධාගමික රාජ්‍යයක් බවට පත් ව නොතිබිණි. කෙසේ වෙතත් වංශකතාවලට අනුව මිහිඳු හිමියන් මෙරටට පැමිණීමත් සමග එම කාර්යය සම්පූර්ණ විය.[12] පැරණි පදිංචිකරුවන් අබිබවා දේශපාලනික වශයෙන් බලවත් වෙමින් සිටි නව සංක්‍රමණිකයන් බුදුදහම රාජ්‍ය ආගම ලෙස පිළිගත් විට දඩයම සහ සත්ව ඝාතනය හා සම්බන්ධ රැකියා පහත් ලෙස සැලකීමේ මතවාදයක් අධිපති කතිකාව තුළ ගොඩනැගිණි. ඉක්බිති ව මහාවංසය ප්‍රමුඛ වංශකතා නාගයන්ට කළ පරිද්දෙන් ම යක්ෂයන් ද රටේ ඉතිහාසයෙන් ඉවත් කරන බව නිරීක්ෂණය කළ හැකි ය. කෙසේ වෙතත්, රෞද්‍ර, අශිලාචාර ජන කොට්ඨාසයක් ලෙස නම් කොට පළමු ව 'ගිරි' නම් දිවයිනට පලවා හරින ලද්දේ යැයි පැවසෙන සහ අනතුරුව විජය විසින් සිරිසවත්තු පුරයේ දී සමූලඝාතනය කළ බව පැවසෙන යක්ෂයන් තවදුරටත් බලවත් කණ්ඩායමක් ලෙස ලංකාවේ විසූ බවට සාක්ෂි තිබේ. මහාවංසයේ ම සඳහන් වන පරිදි විජයගෙන් ඇරඹෙන රාජ වංශාවලියේ නියෝජනයක් වන පණ්ඩුකාභය ඔහුගේ ම ඥාතීන් විසින් ඝාතනය කිරීමට නියමිත වූ විට පණ්ඩුකාභයගේ ජයග්‍රහණය සඳහා උපකාරී වූ බලවත් කණ්ඩායමක් ලෙස යක්ෂයන් සහ පිටුවහල් කරන ලද දිසාලා සහ ජීවහත්ථගෙන් ආරම්භ වූයේ යැයි කියන පුලින්දයන් හෙවත් වැද්දන් දායක වී තිබේ.[13] මෙයින් පසු වංශකතාකරුවන් විසින් රෞද්‍ර, අශීලාචාර යන විශේෂණ සහිත ව

---

12 "අරහත් මහින්ද අහසින් වැඩම කොට, රජු (දේවානම්පියතිස්ස, ක්‍රි. පූ. 250-210) දඩයමේ නිරතව සිටි මිහින්තලා කඳු මුදුනට බසින්නේය. රජු බුද්ධාගමට හරවා ගැනුණා පමණක් නොව, මෙකී වැරදි ක්‍රියාව සිදු වූ ස්ථානය දිවයිනේ මුල්ම භික්ෂූන් වහන්සේ උදෙසා ඉදිකැරුණු භාවනා ස්ථානයක් හා බෞද්ධ පූජනීය හා වන්දනා මධ්‍යස්ථානයක් බවට පත්විය" (ඔබේසේකර, 2018c: 305).

13 ක්‍රි. පූ. 437 දී රාජ්‍යත්වයට පැමිණි පණ්ඩුකාභය රජු ළමාවියේ දී ආරක්ෂා කළ 'චිත්තරාජ' සහ 'කාලවේල' දාසයන් දෙදෙනා කුමරුගේ මාමාවරුන් විසින් මරනු ලැබූ විට බලවත් යක්ෂයන් ව ඉපිද කුමරුන්ට අරක් ගත්තේ යැයි කියන වංශකතා කුමරු සිය මාමාවරුන් සමඟ සටන් කරමින් සිටි කාලයේ අශ්ව වෙස් ගෙන දූම්රක්ගල අවට සැරිසැරූ 'චේතියා' නම් යකින්න අල්ලා ගත් බවත් මාමාවරුන් සමඟ සටන්වල දී මේ යකින්න කුමරුට උපකාරී වූ බවත් කියයි. පණ්ඩුකාභය රජ වූ පසු තමාට උපකාර කළ යක්ෂයන්ට සැළකූ බව ද, වැදි දෙවියා දෙවොලක් කරවා නගරයෙන් උතුරු දිග කඳු ගැට දෙකක් අතර වැද්දන්ගේ ගෙවල් පෙළ තැන වූ බව ද මහාවංශය කියයි.

හඳුන්වන යක්ෂයන් පිළිබඳ තවදුරටත් සඳහන් නොකරන නමුදු 'දඩයක්කාර' ගෝත්‍රිකයන් ලෙස නම් කෙරෙන පුලින්දයන් හෙවත් වැද්දන් ගැන දිගින් දිගට ම සඳහන් කරමින් සිංහල බෞද්ධ රජවරුන්ට සුවිශේෂ සේවයක් කළ සහ එම රජවරුන්ගේ පාලන තන්ත්‍රවල තීරණාත්මක අවස්ථාවල දී බලවත් පිරිසක් ලෙස කටයුතු කළ බව සඳහන් කර ඇත.[14]

මේ සිදුවීම් සියල්ල මෙසේ සාරාංශගත කළ හැකි ය; ස්වදේශික දඩයක්කරුවන්, ආහාර එක්රැස් කරන්නන් මෙන් ම වගා කරන්නන් ද විය හැකි පිරිස සහ ලංකාවට පැමිණි නව සංක්‍රමණිකයන් අතර ප්‍රතිවිරෝධතාවල ප්‍රතිඵලය වන්නට ඇත්තේ නව සංක්‍රමණිකයන් හා තරග කළ නොහැකි වූ පිරිසේ පසුබැසීම සහ නව සංක්‍රමණිකයන්ගේ බලවත් සංස්කෘතිය සහ අර්ථ ක්‍රමය පෙර කී පිරිසේ සංස්කෘතිය සහ අර්ථ ක්‍රමය අබිබවා තහවුරු වීම යි. එම තහවුරු වීමත් සමග නව සංක්‍රමණිකයන් ව්‍යාප්ත වූ ප්‍රදේශවල විසූ ස්වදේශික ප්‍රජාව ද ක්‍රමයෙන් අධිපතිවාදී අර්ථ ක්‍රමය සහ සංස්කෘතිය තුළට ඇද ගනු ලැබිණි.[15] කෙසේ වෙතත් මේ අධිපතිවාදී බලවත් සංස්කෘතියට සහ අර්ථ ක්‍රමයට අනුගත වීම ප්‍රතික්ෂේප කළ පිරිස වනගත ප්‍රදේශවල තවදුරටත් සිටින්නට ඇතුවා සේ ම වැදගත් ම කාරණයක් වන්නේ එම සංස්කෘතිය සහ අර්ථ ක්‍රමයට අනුගත නොවූ සහ වංශකතාකරුවන් විසින් යක්ෂයන් යැයි නම් කළ දඩයක්කරුවන් සහ ආහාර එක්රැස් කරන්නන් ක්‍රමයෙන් රටේ ගිනිකොන දිග පෙදෙසට පසු බැස ගිය බවට සලකුණු තිබීම යි. ක්‍රි. ව. 7 වන සියවසේ දී දේශාටක චීන බෞද්ධ භික්ෂුවක වූ 'හියුං-සාන්' ලංකාව පිළිබඳ ලියූ විස්තරයේ දී යක්ෂයන්ගේ මෙමෙ පසු

යක්ෂයින්, භූතයින් සමඟ යහළුව සිටි ඒ රජු ඔවුන් සමඟ සම්පත් අනුභව කළ බව මහාවංසය, වංසත්ථප්පකාසිනී ඇතුළු ඓතිහාසික මූලාශ්‍රයවල කියැවේ.

14 මහපැරකුම්බා රජු සේනා සංවිධානය කිරීමේ දී, "නොයෙක් දහස් ගණන් ව්‍යාධ පුරුෂයන් සඞ්ග්‍රාමික කර්ම දක්ෂයන් කරවා ඔවුනට අනුරූප වූ කළුරෙදි සහ දුනු හී ආදිය ද" දුන් බව මහාවංසයේ සඳහන් වේ. දහතුන් වන සියවසේ දී ලියැ වී ඇති දඹදෙණි අස්න සඳහන් කරන පරිදි දෙවන පැරකුම්බා රජුගේ සේවාවෙහි නියුක්ත වූවන් අතර වැද්දන් සිටි බව පෙනේ (මීගස්කුඹුර, 1985). උඩරට රාජධානි සමයේ දී වැද්දන් රජු සමග සමීප සම්බන්ධතා පැවැත් වූ බවත් තීරණාත්මක අවස්ථාවල දී රජු විශ්වාසය තැබුවේ වැද්දන් මත බවත් ඔබේසේකර සඳහන් කරයි. බලන්න; ඔබේසේකර 2018b.

15 ජයග්‍රාහී නව සංක්‍රමණික පදිංචිකරුවන් උතුරුදිග තැනිතලාව ඇතුළු දිවයිනේ බොහෝ ප්‍රදේශවලට ව්‍යාප්ත වන අතර එම ප්‍රදේශවල සිටි මුල් පදිංචිකරුවන් ඔවුන්ගේ ආධිපත්‍යය පිළිගනිමින් බෞද්ධයන් බවට පත් වීමේ පුළුල් ක්‍රියාදාමයක් සිදු වූ බවට සාධක තිබේ. ක්‍රිස්තු පූර්ව දෙවන සියවසට අයත් සෙල් ලිපි දෙකක එන 'මිලක තිෂ' සහ 'මිලක පුෂගත' යන පුද්ගල නාම ගැන විවරණයක් කරන සෙනරත් පරණවිතාන (1970) එම පුද්ගල නාම මුලින් ඇති 'මිලක' යන්න විරුද නාමයක් විය හැකි බවත් එය පාලි 'මිලක්ඛ' (සංස්කෘත 'ම්ලේච්ඡ') යන්නෙන් බිඳුණු වදනක් විය හැකි බවත් සඳහන් කරයි. ඒ එසේ නම් ඉන් අදහස් වන්නේ දිවයිනේ ප්‍රාකෘතික (වැදි) ජනතාව බවත් ඔවුන් අතරින් ඇතමෙකු නව ශිෂ්ටාචාරය වැළඳගත්තා පමණක් නොව එම සමාජයේ ඉහල තැන් වෙත පත් වුණු අයුරු ද ඉන් හෙළි වන බව පරණවිතානගේ අදහස යි. අනුරාධපුර යුගයේ එකතු කරන ලද පැරණි සිංහල කතාවස්තු සංග්‍රහයක් මූලාශ්‍රය කරගෙන දාහතර වන සියවසේ දී රචිත සද්ධර්මාලංකාරය 'නේසාද තෙර' යනුවෙන් හැඳින්වුණ භික්ෂුවක පිළිබඳ සඳහන් කර ඇත. 'නේසාද' යන පාලි වචනය 'වැදි' යන අරුතින් යෙදෙන්නකි (උපුටාගැනීම, මීගස්කුඹුර, 1985). දහවෙනි ශතවර්ෂයට පෙර සම්පාදනය වී යැයි කියැ වෙන *සහස්සවත්ථුප්පකරණයේ* ද බෞද්ධ භික්ෂුවක වූ සෝණ නම් දඩයක්කරුවෙකු සහ භික්ෂුණියක් බවට පත් වූ දඩයක්කරුවෙකුගේ බිරිඳක් පිළිබඳ කියැවේ (*සහස්සවත්ථුප්පකරණය*: 1959:78).

බැස යාම පිළිබඳ ව සඳහන් කරයි (බුද්ධදත්ත, 2000). මේ ගිනිකොණ දිග පෙදෙසට මහිංයගණය අයත් නමුණුකුල ප්‍රදේශයෙන් දකුණට වන්නට පිහිටි ඌව-වෙල්ලස්ස ප්‍රදේශ, මොනරාගල දිස්ත්‍රික්කය මෙන් ම වත්මන් මාතලේ දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශ බෙහොමයක් ද සහිත ව සාම්ප්‍රදායික ව වැද්දන් වාසය කළ 'වැදි රට' හෙවත් 'මහ වැදි රට' යනුවෙන් හඳුන්වන ලද ප්‍රදේශ අයත් විය.

දැන් නැවතත් මහිංයගණයේ සමන් දෙවියන් පිළිබඳ අපගේ සාකච්ඡාවට යොමු වෙමු. මෙම පර්යේෂණ ලිපිය ආරම්භයේ දී අප මතු කළ ප්‍රධානතම ගැටලු වූයේ බුදුරජානන් වහන්සේ සරණ ගිය සහ උන් වහන්සේගේ කේශ ධාතු තැන්පත් කොට තමන් විසින් නිර්මාණය කළේ යැයි කියන ඉන්ද්‍රනීල චෛත්‍යය ද පිහිටි මහියංගණයේ දී ම සමන් දෙවියන් අවශේෂ දෙවියකු ලෙස සැලකෙන්නේ මන් ද? මහියංගණ-අලුත්නුවර සමන් දේවාලයේ දී සමන් දෙවිඳුන්ට වඩා එම දෙවිඳුන්ගේ සොහොයුරිය යැයි කියන මහලොකු මැණියන් එම දෙවිඳුන් අබිබවමින් පෙරට පැමිණ ඇත්තේ ඇයි? මහියංගණයේ වැද්දන් සහ සමන් දෙවිඳුන් අතර ඇති සම්බන්ධතාව කුමක් ද යන ගැටලු යි. මෙම ගැටලු විසඳා ගැනීමට නම් මහාවංසය ඇතුළු ඓතිහාසික වංශකතාවල දී සමන් දෙවියන්ගේ භූමිකාව නිරූපණය වී ඇති ආකාරය මෙන්ම එම වංශකතාවල දී රෞද්‍ර, අශීලාචාර, ම්ලේච්ඡ යක්ෂයන් යැයි නම් කළ දඩයක්කරුවන් සහ ආහාර එක්රැස් කරන්නන් විසින් තමන්ගේ ඥාතියෙකු යැයි පවසන එම දෙවියන්ගේ භූමිකාව විශ්ලේෂණය කර ගෙන ඇත්තේ කෙසේ දැ'යි විමසා බැලිය යුතු ය.

## දඩයක්කරුවන්ගේ අර්ථකථනය තුළ සමන් දෙවියන්

ඓතිහාසික බෞද්ධ වංශකතාවලට අනුව බුදුරජාණන් වහන්සේ සරණ ගිය සමන් දෙවියන් ලංකාව තුළ බුදු සසුන ප්‍රතිෂ්ඨාපනය සඳහා සුවිශේෂී  දායකත්වයක් ලබා දුන් අයෙකි. මහාවංසයට අනුව, බුදුසරණ යන සමන් දෙවියෝ බුදු සසුන ලංකා භූමිය තුළ ස්ථාවර ව ප්‍රතිෂ්ඨාපනය වීමට අදාළ වැදගත් බෞද්ධාගමික සිහිවටන දෙකක් පිහිටුවීමට ද දායක වූහ. ඒ බෞද්ධාගමික සිහිවටන දෙක නම්, මහියංගණය ස්තූපය සහ ශ්‍රීපාද ලාංඡනය  යි. මේ අනුව සමන් දෙවියන්ට සිංහල බෞද්ධ දේව මණ්ඩලයේ අතිශය වැදගත් ස්ථානයක් හිමි වී ඇත. එහෙත් නව සංක්‍රමණිකයන් ව්‍යාප්ත වීම නිසා රටේ ගිනිකොණ දිග පෙදෙසට පසු බැස ගිය දඩයක්කරුවන් සහ ආහාර එක්රැස් කරන්නන්ගෙන් පැවත එන්නේ යැයි උපකල්පනය කළ හැකි මහියංගනය-මහඔය ප්‍රදේශයේ වැද්දන් තුළ සමන් දෙවියන්ගේ භූමිකාව පරිකල්පනය වී ඇත්තේ කුමනාකාරයෙන් ද? එම පරිකල්පනය සිංහල බෞද්ධයන් එම දෙවියන් පිළිබඳ ව ගොඩනගා ගෙන ඇති ඇති පරිකල්පනයේ ප්‍රතිපක්ෂය වීම විය හැකි තත්වයකි. ඔවුන්ට අනුව සමන් දෙවියන් යනු, කුවේණිය මෙන් ම සිය වර්ගයා පාවා දුන් ද්‍රෝහියකු බැවිනි. මන්දයත්, තමන් පිටුවහල් කළ බලවත් ආගන්තුකයාගේ පාර්ශ්වය ගෙන එම පාර්ශ්වයේ නියෝජිතයකු ලෙස කටයුතු කළ බැවිනුත්, ඔහු මහියංගනයේ දී තමන්ට පිහිට නොවූ බැවිනුත් ය. එම කියවීම තුළ විමසා බලන විට සමන් දෙවියන්ගේ

මූලිකත්වයෙන් ස්ථාපිත වූ ඉහත කී බෞද්ධ සිහිවටන දෙක ම දඩයක්කරුවන් සහ ආහාර එක්රැස් කරන්නන් විෂයෙහි බෞද්ධාගමික ප්‍රජාවේ ආධිපත්‍යය නිරූපණය වෙයි. මිහිඳු හිමියන් මෙරටට පැමිණීමට පෙර ස්ථාපිත වූවා යැයි කියන මේ බෞද්ධාගමික සිහිවටන දෙක ම පිහිටි ප්‍රදේශ යක්‍ෂයන්/වැද්දන් කේන්ද්‍රගත ව සිටියේ යැයි සිතිය හැකි ස්ථාන දෙකක් ය යන්න ද මෙහි දී සිහි තබා ගත යුතු ය. ඉදින් එවැනි තත්වයක් යටතේ තමන් පීඩාවට පත් කළ අධිපතිවාදී සංස්කෘතියට අනුගත වූ සහ එහි නියෝජිතයෙකු ලෙස ක්‍රියා කරන තමන්ගේ ම කෙනෙකු පිළිබඳ ව පීඩාවට පත් වූ දඩයක්කරුවන් සහ ආහාර එක්රැස් කරන්නන්ගේ ප්‍රතිචාරය කුමක් විය හැකි ද? ඔවුන්ගේ අනිවාර්ය ප්‍රතිචාරය විය හැක්කේ අනෙකාගේ පාර්ශ්වය ගත් තමන්ගේ ඥාතියාට 'විරෝධය පෑම,' 'ප්‍රතික්‍ෂේප කිරීම' සහ 'පලිගැනීම' පමණක් නොව එකී තමන්ගේ ඥාතියා විසින් පිළිගත්තා වූ බලවත් සමාජ සංස්කෘතික සම්ප්‍රදාය කෙරෙහි ද එබඳු ම ප්‍රතිචාර යොමු කිරීම යි. දැන් මහියංගණයට විශේෂිත ව මේ 'විරෝධය පෑම,' 'ප්‍රතික්‍ෂේප කිරීම' සහ 'පලිගැනීමේ' සන්දර්භය තවදුරටත් විස්තරාත්මක ව විශ්ලේෂණය කර ගනිමු.

බුදුරජාණන් වහන්සේට ලංකාවට වඩින ලෙස තමන්ගේ ම මුතුන්මිත්තෙකු ව සිටි සමන් දෙවිඳුන් ඇරයුම් කිරීම 'මෝඩ' ක්‍රියාවක් යැයි මහියංගණ-මහඔය ප්‍රදේශයේ වැද්දන් පවසන අතර, ඉන් ගම්‍ය වන්නේ සමන් දෙවිඳුගේ එම ආරාධනාව පිළිබඳ ව වැදි ප්‍රජාවේ ඇති නොකැමැත්ත යි. වැද්දන්ගෙන් පැවත එන්නේ යැයි කියන මද්දුමබණ්ඩා සඳහන් කරන්නේ බුදුරජාණන් වහන්සේ පැමිණීමට විරුද්ධව සටන් වැදීමට යක්ෂයන් හට උදව් නොකළ බැවින් සහ බුදුරජාණන් වහන්සේගේ පෙළහර දැක්වීම හේතු කොටගෙන යක්ෂයන් පීඩාවට පත් වූ විට ඔවුන්ගේ නායකයා වූ සමන් දෙවියන් සිනා පහළ කළ බැවින් යක්ෂයන් ඔහුට ද පහර දුන් බවයි. සමන් දෙවියන් සම්බන්ධයෙන් යක්ෂයන්ගේ එම ප්‍රතිචාරය තමන්ගේ රටට පැමිණ තමන් පීඩාවට පත් කළ ස්පාඤ්ඤවරුන්ගේ පාර්ශ්වය ගත්තේ යැයි සැක කොට තම වර්ගයා පාවා දුන් ද්‍රෝහියෙකු ලෙස සලකා සිය නායකයා වූ '*මොන්ටෙසුමාට*' පහර දී මරණීය තුවාල සිදු කිරීමේ ඇස්ටෙක්වරුන්ගේ ප්‍රතිචාරය සිහිගන්වයි.[16]

---

[16] ස්පාඤ්ඤවරුන් විසින් 1521 දී සම්පූර්ණයෙන් ම යටත් කර ගත් ඇස්ටෙක් අධිරාජ්‍යයට වත්මන් මෙක්සිකෝවේ දකුණු දිග ප්‍රදේශය, හොන්ඩුරාසය සහ නිකරගුවාව අයත් විය. ඇස්ටෙක් අධිරාජ්‍යයේ පාලකයා ලෙස ක්‍රි. ව. 1502දී පත්වූ '*මොන්ටෙසුමා*' (Montezuma II, also spelled Moctezuma born 1466—died c. June 30, 1520) එම අධිරාජ්‍යය ව්‍යාප්ත කිරීම සඳහා දෙන ලද දායකත්වය නිසා ඇස්ටෙක්වරුන් අතර බෙහෙවින් කීර්තියට පත් වූවෙක් විය. කෙසේ වෙතත් 1519දී ස්පාඤ්ඤ ජනරාල්වරයෙකු වූ '*හර්මන් කෝර්ටෙස්* ' (Conquistadors Hernán Cortés) විශාල යුද බලයක් සහිත හමුදාවක් සමග පැමිණි විට *මොන්ටෙසුමා* ඔවුන් සමග සටන් කරනු වෙනුවට ජනරාල්වරයා ඇතුළු පිරිසට '*ටෙනොච්ටිට්ලන්* ' (Tenochtitlan) නම් සිය පුරවරයට ඇතුළු වීමට අවසර දුන්නේ ය. පුරවරයට ඇතුළු වීමෙන් සති දෙකකට පසු ස්පාඤ්ඤවරුන් විසින් *මොන්ටෙසුමා* ඔහුගේ මාලිගය තුළදී ම සිරභාරයට ගෙන ස්පාඤ්ඤ අධිරාජ්‍යයාගේ යටත් පාලකයෙකු වීමට බලකරන ලද්දේ ය. නිවාස අඩස්සියට පත්කරන ලද මොන්ටෙසුමාගෙන් ඇස්ටෙක්වරුන්ගේ ධනය තමන්ට දෙන ලෙසත් නගරයේ ඇස්ටෙක්වරුන්ගේ ශුද්ධ වූ දේවස්ථානය මුදුනේ කුරුසයක් සවිකිරීමට ද ස්පාඤ්ඤ යෝ බල කර

වංශකතාකරුවන් විසින් සඳහන් කර ඇති පරිදි යක්ෂයන් කුවේණියට පහර දී මරා දමන්නේ ඇය සිය වර්ගයා පාවාදුන් බැවිනි (මහාවංසය, 1996: 41). සමන් දෙවියන්ට විරුද්ධ ව යක්ෂයන්ගේ ප්‍රතිචාරය සඳහන් ඉහත දී උපුටා දක්වූ ජනශ්‍රැති මගින් ද නිරූපණය වන්නේ 'ස්වකීය වර්ගයා පාවා දුන් ද්‍රෝහියා පිටුදැකීමේ' ඇස්ටෙක්වරුන්ගේ යථෝක්ත ප්‍රතිචාරය වැනි ප්‍රතිචාරයක් බව අපගේ හැඟීම යි. ඇස්ටෙක්වරුන් *මොන්ටෙසුමාට* මරණීය තුවාල සිදු කළ පරිදි සමන් දෙවියන්ට මරණීය හානි කිරීමට යක්ෂයන්ට හැකි වූ බවක් ජනශ්‍රැතියේ නොකියැ වේ. එහෙත් යක්ෂයන් බියගන්වා පලවා හැරි බුදුරජාණන් වහන්සේගේ සරණ ගිය සමන් දෙවියන්ට පහරදීම ඇස්ටෙක්වරුන් සිය නායකයා වූ *මොන්ටෙසුමාට* පහරදීමේ වර්ගයේ ද්‍රෝහියා ප්‍රතික්ෂේප කිරීමක් යැයි පරිකල්පනය කිරීම යුත්ති සහගත ය. මහියංගණය-අලුත්නුවර දේවාලය සමන් දෙවියන්ගේ මූලස්ථානය යැයි පැවසුව ද ඔහු එහි දී නොවැදගත් වීම සහ ඔහු අබිබවමින් මහලොකු මැණියන් පෙරට පැමිණීම ද වටහා ගත යුත්තේ ඉහත සඳහන් කළ 'ද්‍රෝහියා පිටුදැකීමේ' සන්දර්භයේ සිට බව අපගේ අදහස යි. කෙසේ වෙතත් සමන් දෙවියන් පිළිබඳ දඩයක්කරුවන්ගේ සහ ආහාර එක්රැස් කරන්නන්ගේ 'විරෝධය පෑම,' 'ප්‍රතික්ෂේප කිරීම' සහ 'පලිගැනීම' සම්බන්ධිත මෙකී ප්‍රතිචාර මත පමණක් පදනම් ව මේ කාරණය පිළිබඳ විනිශ්චයකට පැමිණීම සාධාරණ නොවේ. මේ මොහොතේදීත් මහියංගණ-අලුත්නුවර සමන් දේවාලය ආශ්‍රිත යාතුකර්ම, වත්පිළිවෙත් සහ එම ප්‍රදේශයේ තවමත් ශේෂ ව පවතින පුරාණෝක්ති සහ ජනශ්‍රැතිවලින් සමන් දෙවියන් පිළිබඳ දඩයක්කරුවන්ගේ සහ ආහාර එක්රැස් කරන්නන්ගේ ඉහත කී ආකාරයේ ප්‍රතිචාර නිරූපණය වන බව අපගේ අදහස යි. එම ප්‍රතිචාර නිරූපණය කරන්නා වූ මහියංගණ-අලුත්නුවර සමන් දේවාලය ආශ්‍රිත සුවිශේෂී චාරිත්‍රමය යාතුකර්මයක් වන 'වැදි පෙරහැර' කෙරෙහි මීළඟට අවධානය යොමු කරමු.

## මහියංගණ-අලුත්නුවර සමන් දේවාලයේ වැදි පෙරහැර

මහියංගණ-අලුත්නුවර සමන් දේවාලයේ වාර්ෂික පෙරහැර උළෙලේ වැදගත් අංගයක් වන වැදි පෙරහැරේ ආරම්භය කවදා ද යන්න අවිනිශ්චිත ය. යම් ආකාරයක උත්ප්‍රාසයක් ඇති කරන්නේ වුව ද, වැද්දන් පවා එම පෙරහැරේ ආරම්භය සම්බන්ධ කරන්නේ මහාවංසය ඇතුළු වංශකතාවල විචිත්‍රවත් ලෙස විස්තර කරන බුදුරජාණන් වහන්සේ මහියංගණයට

---

සිටියහ. *මොන්ටෙසුමා* ස්පාඤ්ඤවරුන්ට යටත් වීම සහ ඔවුන්ගේ ඉල්ලීම්වලට එකඟ වීම ඇස්ටෙක්වරුන් අතර ඔහුට තිබූ ගෞරවය බිඳවැටීමට දැඩි ව බලපෑවේ ය. මේ සිදුවීම් අතරතුර එක් අවස්ථාවක දී ස්පාඤ්ඤයෝ ඇස්ටෙක්වරුන්ගේ ආගමික පූජෝත්සවයකට පහර දී ඇස්ටෙක්වරුන් විශාල පිරිසක් මරා දැමූහ. සිය නායකයාගේ තීරණ නිසා ප්‍රකෝපයට පත් ව සිටි ඇස්ටෙක් යුද්ධ භටයින් *මොන්ටෙසුමාගේ* සහෝදරයා වූ '*මොටේකුහෝමා*' (Motecuhzoma) නායකත්වයට පත් කර ගෙන මොන්ටෙසුමා සහ ස්පාඤ්ඤවරුන් සිටි මාලිගයට පහර දුන්හ. ස්පාඤ්ඤයන්ගේ බලකිරීම මත ඇස්ටෙක්වරුන්ට සන්සුන් වන ලෙස පැවසීමට *මොන්ටෙසුමා* මාලිගයේ සඳළුතලයට ගිය විට ඇස්ටෙක්වරු ඔහුට ගල් ගසා හී වලින් විද මරණීය තුවාල සිදු කරන ලද්දේය. එම තුවාල නිසා දින තුනකට පසු *මොන්ටෙසුමා* මිය ගියේ ය (Cartwright, 2013).

පැමිණ යක්ෂයන් දමනය කිරීමේ කතා පුවතට ය.[17] ලංකාවේ වෙනත් කිසිදු ස්ථානයක දී දැකිය නොහැකි මහියංගණ-අලුත්නුවර සමන් දේවාලයේ වාර්ෂික පෙරහැර උලෙළට ම ආවේණික වූ වැදි පෙරහැරට එම දේවාලයේ බස්නායක නිළමේගේ ආරාධනය මත තම ගෝත්‍රික නායකයා සමග පැමිණෙන වැදි ජනයා පෙරහැර පැවැත්වෙන දින දහවල් කාලයේ සිට දේවාල භූමියේ වෙන් කරන ලද ස්ථානයක රැඳී සිට නියමිත වේලාවට පෙරහැරට සම්බන්ධ වනු දැකිය හැකි ය. පෙරහැරට කලින් සහභාගි වී ඇති අවස්ථාවන් ගණන අනුව පළමු තැන ගන්නා අය ශරීරයේ මී පැණි ගල්වා පුළුන් අලවා ගනිති. ඉන් පසු දෙවන ස්ථානය ගන්නා අය ශරීරයේ පරඬැල් අලවා ගන්නා අතර අලුතින් ම සහභාගී වන අය පිදුරු අලවා ගනිති. ඉන් පසු ඔවුහු දික් ව සකස් කර ගන්නා ලද රිටි අතැති ව ලතාවකට නටමින් දේවාලය වටේත්, චෛත්‍යය වටේත් තුන්වරක් ගමන් කරති. ඉන් පසු ඔවුහු මෙම රිටි එකිනෙකට හප්පමින් හූ කියමින් දේවාලය ඉදිරිපිටටත් තවත් ස්ථානවලටත් රිටිවලින් පහර දෙති. දේවාලයේ කපුවෝ දික් වූ රිටි ගෙන දේවාලයත් නිළමේත් ආරක්ෂා කිරීම සඳහා දේවාලය ඉදිරියේත් විශේෂයෙන් බස්නායක නිලමේ සිටින ගල් පුවරුව ළඟත් රැකවල්ලා ගෙන සිටිති. වැදි පෙරහැරේ දී සිදු වන වඩාත් ම වැදගත් යාතු-කර්මීය ක්‍රියාවලිය විස්තර කිරීමට එකී පෙරහැර පිළිබඳ මීට දශක හයකට පෙර ගණනාථ ඔබේසේකරගේ නිරීක්ෂණ උපුටා දක්වන්නේ කාලයාගේ ඇවෑමෙන් සිදු ව ඇති වෙනස්කම්වලින් තොර ව එහි මුල් ස්වරූපය පිළිබඳ අදහසක් ඇති කර ගැනීම සඳහා ය.[18]

> වැදි පෙරහැර පිළිබඳ මගේ විස්තරය 1950 ගණන් අග හා 1960 ගණන් මුල මා දුටු පිළිවෙත් මත පදනම් වේ.... මේ පිළිවෙත් අතුරින් එකකදී හෙල්ල සංකේතාත්මකව දක්වනු පිණිස වූ මුගුරු අතැතිව සමන් හා ස්කන්ද දේවාල අසල පේළිගැසී සිටින වැද්දන් හැත්තෑ එක් දෙනෙකුට දුන්න හා ඊතලය දරන "ප්‍රධානියෙක්" නායකත්වය ලබා දෙයි. ශෝභන නර්තන විලාසයකින් දේවාලය තෙවරක් පැදකුණු කිරීමෙන්

17 මෑතකාලයේ වැදි ප්‍රජාවගේ ප්‍රකට නායකයාව සිටි තිසාහාමිගේ පහත සඳහන් ප්‍රකාශය බලන්න;

.... බුදු හාමුදුරුවන් මහියංගණයට පැමිණි වෙලාවේ එහි සිටි යක්ෂයන් එතුමන් සමග සටනට ආවා. ඒ සටනට ආ ගමනෙන් තමා පෙරහර ඇති වුණේ. බුදු හාමුදුරුවන් වඩින කාලේ බින්තැන්නේ සිටියේ යකුන්. යකුන් කීවාට ඒ අයත් මිනිසුන් - ගෝත්තරයෙන් යකුන්. ඒ යක්ෂයන් එහි සිටියදි බුදුන් වහන්සේ එහි වැඩම කළේ එතැනින් ඉඩ ටිකක් ලබා ගන්නයි. එසේ ඉඩ දෙන්න බෑ කියලා සැර දමමින් ආවා. අද දවසෙත් ඔය පැවැත්වෙන්නේ එහිදී යක්ෂයන් සැර දම දමා ගිය ආකාරයයි. ඒ ආකාරයට ම කෝටු ඇරගෙන මී පැණි ඇඟේ ගාගෙන හූ කියාගෙන පෙරහරේ යනවා (උපුටාගැනීම, රත්නපාල, 2003: 131).

18 අපගේ මෙම අධ්‍යයනය සඳහා සුමන සමන් දෙවියන් පිළිබඳ මූලික සාහිත්‍ය විමර්ශනය සහ මහියංගනය ප්‍රදේශය ආශ්‍රිත ව පවතින පුරාණෝක්ති සහ ජනශ්‍රැති සොයා යාම 2017 වසරේ සිට ආරම්භ කළත් වැදි පෙරහැර ආශ්‍රිත යාතුකාර්මීය වත්-පිළිවෙත් නිරීක්ෂණය කිරීම සිදු නොවී ය. අපගේ අපේක්ෂාව වූයේ 2020 වසරේ දී මහියංගණ-අලුත්නුවර සමන් දේවාලයේ වාර්ෂික පෙරහැර උලෙළ නිරීක්ෂණය කිරීමට ය. එහෙත් Covid-19 වසංගතය නිසා රටේ ඇති වූ වාතාවරනය හේතුවෙන් 2020 සහ 21 දෙවසරේ දී ම වැදි පෙරහැර නිරීක්ෂණයට අවස්ථාව නොලැබිණි.

> පසු වැද්දෝ සිය ප්‍රධානියාගේ සන් කිරීමකට අනුව, ක්ෂණිකව තාල වේගය වැඩි කරමින්, රැස්ව සිටින සිංහල ප්‍රේක්ෂකයන් භීතියට පත් කරමින් අතැති හෙලි ලෙලවමින් හූ කීමටත් ඝෝෂා කිරීමටත් පටන් ගනිති. විහාරය ඉදිරිපිටදී එහි පඩි පෙලට හෙල්ලෙන් ඇණ එයට "පහරදීමෙන්" ඔවුහූ සටන් කීපයක් රඟ දක්වා පෙන්වති. ඉක්බිති විහාරය වෙත දිවයන ඔවුහූ, බුදුන්ගේ ධාතු නිධන් කොට ඇති ස්තූපය ඇති පරිශ්‍රයට ඇතුළු වීමට උත්සාහ දරති. එවිට මුරකරුවෝ "උඹලාට මෙහි ඒම තහනම්... ආපසු රජ වීදියට පලයල්ලා" (රජ වීදිය, මුර දේවතාවුන්ගේ පූජාසනය) යයි කෑ ගසා ඔවුන්ගේ මග අවුරති. මේ ව්‍යාජ සටන් රඟ දැක්වීම කීප වරක්ම සිදු කිරීමෙන් අනතුරුව, වැද්දන් ස්තූපය මත මෘදු ලෙස හෙලි තබා ඊට වන්දනා කිරීමෙන් එය අවසන් වේ. ඊළඟට විහාරය කරා දිවයන ඔවුහූ, ස්තූපය අසලදී මෙන් එහිදීද සටනක් රඟ දක්වා, බලා සිටින භික්ෂූන්ට වැඳීමෙන් එය අවසන් කරති. ඉන්පසුව දේවාලය කරා ආපසු යන ඔවුහූ, තවත් "සටනක්" රඟ දක්වන්නේ තම හෙලි කුඩා කැබලිවලට කැඩෙන තුරු ගල් පඩි මත ඒවා ගසමිනි. අවසානයේ ඔවුහූ දේවාලයේ සිටින දෙවියන්ට බිම වැටී වඳිති. ඉනික්බිතිව අසල පිහිටි ගංගාව ("දෙවිවරුන්ගේ තොටුපළ") කරා දිවයන ඔවුහූ ස්නානය කොට පිරිසිදු වෙති. සන්සුන්ව පෙරළා දේවාලයට එන ඔවුන්ට දූන් ඇතුළු කුටියට ප්‍රවේශ වීමට අවසර ලැබෙන අතර එහිදී සිංහල කපුරාල සමන් හා ස්කන්ද දෙවිවරුන්ට යාතිකා කොට වැද්දන් "සඳුන් දියෙන්" පවිත්‍ර කොට ආශිර්වාද කරයි. පිළිවෙල අවසන් වන්නේ වැදි හා සිංහල දේව මණ්ඩලවල නිල ප්‍රධානියා හා ශ්‍රී ලංකාවේ මහා භාරකාර දෙවිඳුන් වන ස්කන්ද දෙවියන්ට ප්‍රශංසා කරන යෙදුම වූ හරෝ හරා යන්න වැද්දන් විසින් මහ හඬින් පැවසීමෙනි (ඔබේසේකර, 2018c: 305-6).

ඔබේසේකරට අනුව, වැදි පෙරහැර හා සම්බන්ධ මෙම යාතු කර්ම චාරිත්‍ර මගින් සිංහල බෞද්ධයන් සහ දඩයක්කාර වැද්දන් මුළුමනින් ම වෙනස් කණ්ඩායම් දෙකක් ලෙස නිරූපණය කිරීම සිදු වේ. අප ඉහතින් සඳහන් කළ 'ද්‍රෝහියා පිටුදැකීමේ සන්දර්භයේ සිට' විශ්ලේෂණය කළහොත්, වැදි පෙරහැර ආශ්‍රිත ව වැද්දන් විසින් සිදු කරන යාතු කර්ම වත්-පිළිවෙත් මෙන් ම ඒ සම්බන්ධයෙන් ප්‍රදේශයේ පවතින ජනශ්‍රැති මගින් සමන් දෙවියන් පිළිබඳ පමණක් නොව ඔහු විසින් පිළිගන්නා ලද බෞද්ධාගමික සම්ප්‍රදාය කෙරෙහි ද යක්ෂයන්ගේ විරෝධය පළ වන බව පෙනී යයි. එම අදහස තවදුරටත් විස්තර කිරීමට ප්‍රථම වැදි පෙරහැරෙන් නිරූපිත යාතුකාර්ම වත්-පිළිවෙත් පිළිබඳ ඔබේසේකරගේ විශ්ලේෂණය සලකා බලමු:

> සිංහලයන් හා වැද්දන් මහියංගණයේදී ඉටු කරන පිළිවෙත්වල සමාජ ක්‍රියාකාරිත්වයේ වෙනස සිත්ගන්නාසුලුය. සිංහලයන් සම්බන්ධයෙන් ගත් විට,

> ඔවුන් අතරින් එක් කණ්ඩායමක් තවත් එකකින් වෙන් කරන පිළිවෙත් එහි දක්නට නැත. පැමිණ සිටින සියලු සිංහලයන් මහියංගණයේදී පොදු වන්දනාවට එකතුවන එකම සදාචාරවත් ප්‍රජාවකි. වැද්දන් ගත්විට, ප්‍රධාන ආගමට සාපේක්ෂව ඔවුන්ගේ තත්ත්වය පිළිවෙත් මගින් නිර්ණය කෙරෙන අතර එයින් ඔවුහු විහාරයට හා ස්තූපයට ඇතුළුවීම වළක්වනු ලැබෙති. නිල වශයෙන් බුදුන් පිළිගැනීමට ඔවුනට බල කෙරුණත් ඔවුන් පැහැදිලිවම සිංහල-බෞද්ධ ප්‍රජාවගෙන් පිටස්තරයෝ වෙති. එසේවුවද, ඔවුහු සපුරා ආගන්තුකයෝද නොවෙති. මුලදී ස්කන්ධ හා සමන් දෙවිවරුන් ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව ඔවුහු, මේ දෙවිවරුන් තමන්ගේ දේව මණ්ඩලවලටද නායකත්වය දෙන බව අවසානයේ පිළිගනිති. තවද, මුර දේවතාවන් බෞද්ධයන්ගේ ආරක්ෂකයන් පමණක් නොව ලෞකික බල ප්‍රදේශයේ ආරක්ෂකයන්ද වන බව පිළිගත යුතුය. මෙහිදී සිදුවන්නේ වැද්දන් "රාජ්‍ය" ව්‍යුහයට අන්තර්ග්‍රහණය කර ගැනීම මිස, ස්තූපයෙන් සංකේතාත්මකව නියෝජනය වන්නාවූ බෞද්ධ "ජාතියට" නොහොත් ශාසනයට ඇතුළු කරගැනීමක් නොවේ (ඔබේසේකර, 2018c: 306).

ඔබේසේකරට අනුව නිල වශයෙන් බුදුදහම පිළිගැනීමට වැද්දන්ට බලකෙරුණේ වුව ද ඔවුන් 'බෞද්ධ ජාතියට' ඇතුළත් කර ගැනීමක් සිදු නොවේ. දැඩි ව අවධාරණය නොකරන්නේ වුව ද සමන් දෙවියන් විසින් පිළිගනු ලැබුවා වූ බෞද්ධාගමික සම්ප්‍රදාය සහ සංක්‍රමණික ප්‍රජාව කෙරෙහි වැද්දන්ගේ විරෝධය ද මේ යාතු කර්ම චාරිත්‍රවලින් නිරූපණය වන බව වැදි පෙරහැර පිළිබඳ ඔබේසේකරගේ මෙම නිරීක්ෂණයෙන් ගම්‍ය වේ. මහියංගණ වැදි පෙරහැරේ මේ වන විටත් සිදු කරන චාරිත්‍රමය වත්-පිළිවෙත් නිරීක්ෂණය කරන විට සහ පසුගිය කාලයේ දී මහියංගණයේ වැද්දන් පිළිබඳ ශාස්ත්‍රීය පර්යේෂණ සිදු කළ පර්යේෂකයින්ගේ ලිපි ලේඛන මෙන් ම එකී වැද්දන් පිළිබඳ වාර්තා කර ඇති අනෙක් ලේඛකයන්ගේ විස්තරකරණ ද සලකා බලන විට අපගේ මේ පරිකල්පනයට තර්කානුකූල පදනමක් තිබෙන බව වැටහෙනු ඇත.

මෑත කාලයේ වැදි ප්‍රජාවගේ ප්‍රකට නායකයා ව සිටි තිසාහාමි 1960 දශකයේ මුල් භාගයේ දී සම්මුඛ සාකච්ඡාවට ලක් කළ සිල්වාට අනුව, වැද්දන් මහියංගණ දේවාලයට එන්නේ මිනිසුන්ගෙන් සහ අලින්ගෙන් ආරක්ෂාව ලබා ගැනීම සඳහාය (සිල්වා, 1964: 34-5). ඒ අනුව දඹානේ වැද්දෝ මහියංගණයේ වාර්ෂික උත්සවයට සහභාගි වුව ද බෞද්ධාගමික කටයුතුවලට සහභාගි නොවෙති (මීගස්කුඹුර, 1991). එපමණක් ද නොවේ; වැදි පෙරහැර හා සම්බන්ධ යාතුකර්ම වත්-පිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ දී වැද්දන් එම අවස්ථාව 'තමන්ගේ නොවන අනෙකා' (මෙම සන්දර්භය තුළ දී සිංහලයන්) සම්බන්ධයෙන් සිය විරෝධය ප්‍රකාශ කිරීමට ද අවස්ථාවක් කර ගන්නා බව පෙනේ. වැදි පෙරහැර හා සම්බන්ධ යාතුකර්ම වත්-පිළිවෙත් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ව 1970 දශකයේ අගභාගයේ දී වාර්තා කළ

ලේඛකයෙකුට ඒ සම්බන්ධයෙන් එවකට වැදි නායකයා ව සිටි ඌරුවරිගේ තිසාහාමි විසින් කර ඇති ප්‍රකාශයක කොටසක් මෙසේ ය.

> හඳ පායලා වරුවක් යන වෙලාවට බෙරයක් අරන් වීදියේ යනවා. වීදියේ යන ගමන් කියනව 'වැද්දන්ගේ පෙරහැර එනවා. පාරේ මිනිහෙක් ඉන්න එපා කඩයක් පවත්වන්න එපා වැද්දෝ දං ඒ ගොල්ලන්ගේ පෙරහැර යනවා.'... දැං ටික කාලයක ඉඳල නැහැ ඒ කාළේ නම් අනිත් මිනිස්සුන්ටත් හුඟක් කරදරේ පාරේ ඉන්න දෙන්නේ නැහැ. මිනිසුන්ටත් එහා මෙහා යන්න තහනම්... ඒ විදිහට තමයි පෙරහැර ගෙනිච්චේ. ඒ විදිහට ඉඩ දුන්නේ නැත්නං ගුටි බැට දෙනව (රත්නපාල, 1978: 25-26).

වැදි බස පිළිබඳ පර්යේෂණ කළ වාග්විද්‍යාඥයකු වන සුගතපාල ද සිල්වාට 1960 දශකයේ මුල දී වැදි නායක තිසාහාමි මේ පිළිබඳ ව ප්‍රකාශ කර ඇත්තේ මෙලෙසිනි; "හූ කියාගෙන පාරේ දුවනව. ඒ වෙලාවට මිනිහෙක්, අලියෙක්, කඩයක් ඇහැට අසු වුණොත් දුවන ගමන් ඒ ගොල්ලන්ට ගුටි දීගෙන හූ කියාගෙන යනවා... (සිල්වා 1964: 35). වැදි පෙරහැර පිළිබඳ ඔබේසේකර කර ඇති විස්තරයේ දී වැද්දන් බුදුරදුන්ගේ ධාතු නිධන් කර ඇති ස්ථූප පරිශ්‍රයට ඇතුළු වීමට උත්සාහ කරන විට වැද්දන් සහ මුරකරුවන් අතර ඇති වන අන්තර් ක්‍රියකාරිත්වයත්, ඉහතින් සඳහන් කළ රත්නපාලගේ විස්තරයත් මත පදනම් වෙමින් එළඹිය හැකි නිගමනය වන්නේ සමන් දෙවියන් පමණක් නොව මහියංගණ බෞද්ධ පුදබිම හා සම්බන්ධ 'තමන්ගේ නොවන අනෙකා' සම්බන්ධයෙන් ද වැද්දන්ගේ ප්‍රතිවිරෝධය යි. ඒ අනුව, ඔබේසේකර පවසන පරිදි සිංහලයන්ගේ පාර්ශ්වයෙන් වැද්දන් 'බෞද්ධ ජාතියට' ඇතුළු කර ගැනීමක් සිදු නොවෙනවා පමණක් නොව වැද්දන්ගේ පාර්ශ්වයෙන් බෞද්ධයන් (සිංහලයන්) ප්‍රතික්ෂේප කිරීමක් මෙන් ම ඔවුන්ට එරෙහි ව විරෝධයක් ද මෙහි දී නිරූපණය වන බව පෙනී යයි. මේ අදහස ඔස්සේ යමින් මහියංගනයේ ජනතාව අතර ශේෂ ව පවතින තවත් ජනශ්‍රැතියක් වෙත යොමු වෙමු:

> සමන් දෙවිඳුන්ට මහ ලොකු මැණියන් හැර 'මිනීපුලුටී' නම් තවත් සොයුරියක් සිටියාය.[19] සමන් දෙවිඳුන් ආරම්භ කළා යැයි විශ්වාස කෙරෙන මහියංගන ඇසළ පෙරහැර බැලීමට මහලොකු මැණියන් මිනීපුලුටී සොහොයුරියද කැඳවා ගෙන ඒමට ඇය වාසය කළ උණකිරිගල පර්වතය වෙත ගියාය. තම සොයුරා සිදු කරන්නට යන මංගල පෙරහැර උත්සවය පිළිබඳ පුවත ඇසුව ද මිනී පුලුටී සොයුරිය එය නැරඹීමට යාම කෙරෙහි දැඩි සේ විරෝධය පළ කළාය. ඊට හේතුව

[19] මහියංගණයට ආසන්න උඩත්තව ප්‍රදේශයේ දී අපට හමු වූ 65 හැවිරිදි ඒ. එම්. ධර්මරත්න, සමන් දෙවිඳුන්ට සොහොයුරියන් සත්දෙනෙකු සිටියේ යැයි කියයි.

ඇය මනුෂ්‍ය වාසයට කිසිදු අයුරකින් කැමැත්තක් නොදක්වූ බැවිනි. පෙරහැර නැරඹීමට මහලොකු මැණියන් කළ යෝජනාවට ඇය දුන් පිළිතුර වූයේ තමා එහි ගියොත් 'අන් අයගේ' ගෙල මිරිකා ලීමේ ආශාවක් ඇති වන බවයි.

මේ පුරාණෝක්තියේ කිය වෙන 'අනෙකා' කවරෙක් ද? සමන් දෙවිඳුන්ගේ මග යමින් බුදුසරණ ගිය අය (හෝ නව සංක්‍රමණිකයන්) විය හැකි ය. මිනීපුලුටී තථ්‍ය වශයෙන් ම සිටියේ ද නැත් ද යන්න කෙසේ වෙතත් මේ ජනශ්‍රැතියෙන් සුවිශේෂී ඓතිහාසික අර්ථයක් කියැ වේ. එනම්, අශිෂ්ටයන් ලෙස සලකා සිය නෑයන් පිටමං කිරීම, සිරිසවත්තු පුරයේ දී තම පූර්වජයන් සමූලඝාතනය කිරීම පිළිබඳ පුවත් අසා දැන සිටි දඩයක්කරුවන් සහ ආහාර එක්රැස් කරන්නන්ගෙන් පැවත එන ප්‍රජාවට තම ගෝත්‍රයට හානි කළ පිරිස පිළිබඳ ඇති විරෝධය යි.

ස්වකීය ගෝත්‍රයට හානි කළ අය පිළිබඳ දඩයක්කරුවන්ගේ 'විරෝධය පෑම සහ ප්‍රතික්ෂේප කිරීම' හා සම්බන්ධ මේ ක්‍රියාවලියට බුදුසමය පිළිගත්තේ යැයි කියන සමන් දෙවියන් මුහුණ දෙන්නේ තමා ද්‍රෝහියකු ලෙස සලකන ලදුව ද්‍රෝහියා පිටුදැකීමේ සන්දර්භය තුළ දී ය. ඒ අනුව, සමන් දෙවියන්ගේ ඉරණම වී ඇත්තේ සිය වර්ගයා අතරින් ප්‍රතික්ෂේප වීම බව අපගේ අදහස යි. එසේ පැවසීමට අපට ඇති හේතු සාධක මොනවා ද? ඔබේසේකර පවසන ආකාරයට, මහාවංසයට අනුව සහ මහියංගණයේ ජනශ්‍රැතිවලට අනුව පුරාණ යුගයේ වැදි දේව මණ්ඩලයේ නායකයා වූයේ සමන් දෙවියන් ය. එහෙත් පසු ව සමන් දෙවියන් එතැනින් විතැන් වී කතරගම දෙවියන් එම ස්ථානයට පැමිණ තිබේ. වැදි පෙරහැර හා සම්බන්ධ වැද්දන්ගේ යාතුකර්ම "පිළිවෙත අවසන් වන්නේ වැදි හා සිංහල දේව මණ්ඩලවල නිල ප්‍රධානියා හා ශ්‍රී ලංකාවේ මහා භාරකාර දෙවිඳුන් වන ස්කන්ධ දෙවියන්ට ප්‍රශංසා කරන යෙදුම වූ හරෝ හරා යන්න වැද්දන් විසින් මහ හඬින් පැවසීමෙනි" (ඔබේසේකර, 2018cː 306). අප සිතන්නේ පුරාණ යුගයේ තමන්ගේ නායකයා ව සිටි සමන් දෙවියන් ප්‍රතික්ෂේප කොට ස්කන්ධ දෙවියන්ට වැද්දන් ප්‍රශංසා කරන්නේ ඔවුන් අතරින් සමන් දෙවියන් ප්‍රතික්ෂේප වී ඇති නිසා බව යි. මෙලෙස වැද්දන් අතරින් සමන් දෙවියන් ප්‍රතික්ෂේප වීම සහ කතරගම දෙවියන් පිළිගැනීමට පාත්‍ර වීමේ පසුබිම කාරණා දෙකක් ඔස්සේ විග්‍රහ කළ හැකි ය.

පළමු ව, බුදුරදුන්ට මෙරටට වැඩම කිරීම සඳහා ආරාධනා කිරීම සහ බුදුන්සරණ යාම යන කාරණ නිසා වැද්දන් අතරින් ඔවුන්ගේ නායකයා ව සිටි සමන් දෙවිඳුන් ප්‍රතික්ෂේප වීම සිදු විය හැකි බව ඉහත දී පෙන්වා දී ඇත. එම ප්‍රතික්ෂේප වීමට සමගාමී ව කතරගම දෙවියන් පිළිගැනීමට පාත්‍ර වීම සිදු වන්නේ කෙසේ ද? ඉතිහාසයේ කිසිදු තැනක කතරගම දෙවියන් බුදුදහම වැළඳ ගත් බව නොකිය වෙයි. එසේ ම වැද්දන්ගේ දඩයම සහ මාංශ අනුභවය ද කතරගම දෙවියන් අබියස දී නිග්‍රහයට ලක් නොවේ. ඔබේසේකර පෙන්වා දෙන පරිදි

කතරගම දෙවියන් හා සම්බන්ධ ලංකාවේ වැදගත් ම පුදබිම වන කතරගම දේවාල පුදබිමේ වර්තමානයේ දක්නට ලැබෙන මධ්‍යම පන්තිකරණයට පෙර දේවාලය අසල මුව මස් විකිණීමට අවසර තිබූ අතර දෙවියන්ට පිළිගන්වන අඩුක්කුවල මුව මස් තැබිණ (ඔබේසේකර, 2018c: 307). බුදුසරණ ගිය ඥාතියා වූ සමන් දෙවියන් අයත් බෞද්ධ සම්ප්‍රදායේ දී දඩයම සහ මාංශ භක්ෂණය ප්‍රතික්ෂේප වන විට කතරගම දෙවියන්ට ඒවා අකැප නොවීම වැද්දන් අතරින් සමන් දෙවියන් ප්‍රතික්ෂේප වීම සහ කතරගම දෙවියන් පිළිගැනීම කෙරේ බලපෑවේ ය යන්න නිසැක ය.

මහියංගණයේ දී වැද්දන් අතරින් සමන් දෙවියන් ප්‍රතික්ෂේප වීම සහ කතරගම දෙවියන් පිළිගැනීමට පාත්‍ර වීම යන්නට අදාළ දෙවන කාරණය පළමු කාරණයට ද වඩා වැදි ප්‍රජාව විෂයෙහි සංවේදී වන්නකි. මහියංගණ-අලුත්නුවර සමන් දේවාලයේ ප්‍රධාන කපු මහතා වන මද්දුමබණ්ඩාට අනුව සමන් දෙවිඳුන්ට බිරින්දෑවරුන් තිදෙනෙකි. "සමන් දෙවියන්ට පවුල් තුනක් ඉඳල තියෙනවා. පළමුවෙං අරං තියෙන්නේ වැදි පරපුරේ කෙනෙක්. එයා නැති වුණාට පස්සේ ගොවිගම කෙනෙක් අරං තියෙනවා. එයත් නැති වුණාට පස්සේ නාග කන්‍යාවක් බැඳලා තියෙනවා." ජනප්‍රවාදයට අනුව සමන් දෙවිඳුන්ගේ මේ විවාහ තුන ම සිදු වන්නේ එක් බිරිඳක් මිය යාමෙන් පසු තවත් බිරිඳක් ලෙසය. එහෙත් මෙහි දී වැදගත් වන්නේ දඩයමට එරෙහි වූ බෞද්ධාගමික සම්ප්‍රදාය අනුගමනය කළ කෘෂිකාර්මිකයන් සමඟ සහ බුදුරදුන් මෙරටට පැමිණි පළමු අවස්ථාවේදී ම උන්වහන්සේ සරණ ගිය නාගයන් සමඟ සමන් දෙවියන් සිය දෙවන සහ තෙවන විවාහ සම්බන්ධතා ඇති කර ගැනීම යි. සමන් දෙවිඳුන් සිය බිරිඳ මිය ගිය පසු දෙවන බිරිඳ ලෙස ගොවි කුලයට අයත් කෙනෙකු සහ ඇයගෙන් පසු නාග කන්‍යාවක් බිරිඳ ලෙස ගැනීමෙන් වැද්දන් සහ ඔහු අතර සබඳතාව දුරස් වේ. එහෙත් කතරගම දෙවියන් සම්බන්ධයෙන් අපට හඳුනා ගත හැකි වන්නේ සමන් දෙවියන් සහ සම්බන්ධ තත්ත්වයේ ප්‍රතිපක්ෂය යි. ඉන්දියාවෙන් මෙරටට එන කතරගම දෙවියන් විජය විසින් පිටුදකින ලද කුවේණියගේ සහෝදරියගේ දියණිය බිරිඳ කර ගනී. වැද්දෝ මේ බිරිඳ වන වල්ලි අම්මා සිය අක්කා ලෙස සලකති. "කුවේණිගේ අක්කාට දුවක් ඉඳළා තියෙනවා. එයැයි ඉන්න කාලෙදී අක්කා හේනට ගිහින් තියෙනවා. කතරගම දෙයියෝ ආවෙ ඉන්දියාවෙන් ලංකාවට එන්න (මූදෙන්) එන්න ආවා. ඒ එන වේලාවේදී අපේ අක්කා හේනෙ ඉන්නවා එයාට පෙනුනා. ඒ දැකලා ඒ අක්කා හොරෙන් අරන් ගියා" (උපුටා ගැනීම සිල්වා, 1964: 27). වැද්දෝ සිය වනගත ජීවිතයේ අතුරු ආන්තරාවලට පිහිට වන ලෙස සිය අක්කා යැයි සලකන වල්ලි අම්මාගෙන් සහ ඇය විවාහ කර ගත් බැවින් සිය මස්සිනා බවට පත් වූ කතරගම දෙවිඳුන්ගෙන් ඉල්ලා සිටිති:

> කැලේ යතත්, කොහේ යතත්, හේනක් කොටතත් ඒ අයට ඒ වෙලාවට අපි කියනව අපේ වල්ලි අම්මේ, අපේ කතරගම දෙයියනේ, මස්සිනේ, අක්කේ, හොඳින්

> පිහිටවෙලා, අපට හුඟක් අලියගෙන් හරි, සර්පයගෙන් හරි මොන එකකුගෙන් හරි අනතුරක් වෙන්න දෙන්න එපා. හේන අලියා විනාශ කරාවි. කාවි. ඒකට පිහිට වෙන්න" කියල පොල් ගෙඩියක් අරගන ඒක උඩකින් තියනවා. ඒ තියල ඒ වෙලාව එනකොට ඒ පොල් ගෙඩියයි, බතුයි, එතකොට කැලේට ගෙනිහිල්ලා ඒ කැලේදි ඒක උයාලා ඒ අයට පිළිගන්වනව. කතරගම දෙයියන්ට, වල්ලි අම්මා දෙයියන්ට " හොඳින් අපිව ආරස්සාකරගන්ට ඕනෑ. අපේ හේනට පිහිට වෙන්න ඕනෑ. කැලෙන් රස්සාව, හුඟක් මී ලබාදෙන්න ඕනෑ" කියල හුඟක් ඒ අයට බාරවෙනව (උපුටා ගැනීම සිල්වා, 1964ː 31).

පිහිටාධාර අවශ්‍ය අවස්ථාවේ දී තමන්ට පිහිට නොවූ, ම්ලේච්ඡයන් යැයි සලකා තමන් ව පිටුදකින ලද අනෙකා සමඟ සම්බන්ධ වූ සමන් දෙවියන්ට වැද්දන් අතර පිළිගැනීම නැති ව යාම සිදු විය හැකි දෙයක් සේ ම පිටතින් පැමිණිය ද, තමන්ගේ ජීවනෝපාය මාර්ගය හෙලා නොදුටු සහ විවාහයෙන් ඥාතිවරයකු බවට පත් වූ කතරගම දෙවියන් වැද්දන් අතරේ දී පිළිගැනීමට පාත්‍ර වීම ද ස්වාභාවික තත්ත්වයකි. මේ අනුව කතරගම දෙවියන් වැදි දේව මණ්ඩලයේ ප්‍රධානියා බවට පත් වීම තාර්කික ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.

මහියංගණ ප්‍රදේශයේ ජනතාව අතර පවතින ජනශ්‍රැති සහ පුරාණෝක්තිය අසන අපට සිතෙන්නේ මේ පිටුදැකීම සහ බැහැර කිරීමේ සීමා කඩඉම මෙයිනුත් ඔබ්බට ගිය පලිගැනීමක් ද වන බව යි. සමන් දෙවිඳුන්ගේ වාහනය සුදු ඇතෙකි. එහෙත් එම දෙවියන් නිරූපණය කර ඇති කිසිඳු තැනක ඔහු සිය සුදු ඇත් වාහනය මත හිඳ සිටින ආකාරය නිරූපණය නොවේ.[20] සමන් දෙවිඳුන් සිය සුදු ඇත් වාහනය මත නොහිඳ ගන්නේ ඇයි? වංශකතාවල සඳහන් නොවන එම හේතුව පිළිබඳ මහියංගණයේ ප්‍රචලිත ව පවතින සිත්ගන්නා සුලු පුරාණෝක්තිය වෙත අපගේ අවධානය යොමු කරමුː

> ඒ කාලේ ටොයිලට් පහසුකම් නැහැනේ. කැලේ කොලේට යන්න තියෙන්නේ. ඒ ගිය වෙලාවක වැද්දෙක් අටවපු යතුරු දුන්නක් ගැස්සිලා තියෙනවා සමන් දෙවියන්ට ඒ වෙලාවේ තුවාල වෙලා තියෙනවා. නාග කන්‍යාවට (බිරිඳට) මේක කියන්න ලැජ්ජයි. ඔක්කොටම හොරෙං මෙයා ගියා සිරිපාද අඩවියට මේකට බෙහෙත් කරන්න. ඒ ගිහිං ඉන්න කොට තමයි බුදු හාමුදුරුවෝ මෙහෙට වැඩලා තියෙන්නේ. එහේදී තමයි සමන් දෙවිහාමුදුරුවන්ට සුදු ඇතා අහුවෙලා තියෙන්නේ. ඒ වුනාට පිටු පස්සේ තුවාලේ නිසා තමයි එයා ඇතා පිට වාඩි වෙන්නේ නැත්තේ.

[20] එනමුත් 2015 වසරේ පේරාදෙණිය නගරයේ සිට කි.මී. 07 දුරින් මුරුතලාව ප්‍රදේශයේ අලුතින් ස්ථාපිත කර ඇති නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය නමැති බෞද්ධ ආරාමයේ සමන් දේව ප්‍රතිමාව ඉදිකර ඇත්තේ සමන් දෙවිඳුන් සිය ඇත් වාහනය මත හිඳගෙන සිටින ආකාරයටය.

ජනශ්‍රැතියේ දී මේ සිදුවීම පලිගැනීමක් වශයෙන් සඳහන් නොකෙරෙන බව කිව යුතු ය. ජනශ්‍රැතිය පවසන්නේ සමන් දෙවියන්ගේ පසුපස පෙදෙස තුවාල වී ඇත්තේ 'වැද්දකු' විසින් අටවන ලද යතුරු දුන්නක් ගැස්සීමෙන් බව යි. එය සිදු ව ඇත්තේ සමන් දෙවිඳුන් සිය වර්ගයාගෙන් පිටස්තර ව නාග කන්‍යාවක සිය බිරිඳ කොට ගෙන සිටියදී ය. ජනශ්‍රැතියේ දී මේ සිදුවීම පලිගැනීමක් වශයෙන් සඳහන් නොවූව ද, අප මෙම කතා පුවත ඉහතින් සඳහන් කළ 'ප්‍රතික්ෂේප කිරීමේ, විරෝධය පෑමේ සහ පලිගැනීමේ' සන්දර්භයේ තබා පරිකල්පනය කළ හොත් ගොඩනැගෙන අදහස කුමක් ද? සතුරා විඳවන ආකාරයේ දඬුවමක් පැමිණවීම සතුරන්ගෙන් පලිගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම නො වේ ද? ඒ අර්ථයෙන් ගත් කල පිටුදැකිය යුතු ද්‍රෝහියාගේ පිටුපස පෙදෙස තුවාල කිරීම පිළිබඳ ව සිතා බලන්න. සිරුරේ ඒවැනි ස්ථානයක ඇති වන තුවාල ඉක්මනින් සුව නොවන්නේ සිරුරු කිස කරන විට තුවාල විදාරණය වන බැවිනි.[21]

යථෝක්ත ජනශ්‍රැතිය විශ්ලේෂණය කරන විට, සමන් දෙවියන් මහියංගණ පෙදෙසේ දී බල රහිත අවශේෂ දෙවියකු බවට පත්වූයේ මන් ද යන ගැටලුවට පිළිතුරක් එමගින් ලැබේ. මෙහි දී තරමක් සංකීර්ණ තවත් ගැටලුවකට විසඳුමක් සොයා ගැනීමට අපට සිදු වේ. එම ගැටලුව නම්, යක්ෂයන් සමන් දෙවියන්ට එරෙහි වන විට ඔහු බේරාගත් මහලොකු මැණියන් යක්ෂයන්ගෙන් පැවැත එන්නා වූ ජනතාව අතර පිළිගැනීමට පාත්‍ර වූයේ ඇයි ද? යන්න යි. මෙම ගැටලුව සංකීර්ණ වනවා යැයි අප කියන්නේ යක්ෂයන් විසින් පිටුදකින ලද සමන් දෙවියන් බේරා ගැනීමට මැදිහත් වන්නේ මහලොකු මැණියන් යැයි ජනශ්‍රැතියේ කියැවෙන හෙයිනි. ද්‍රෝහියෙකු ලෙස සලකන ලද තැනැත්තා බේරාගත් ඇය මහියංගණයේ දී පිළිගැනිමට පාත්‍ර වන්නේ කවර පදනමකින් ද?

මහාවංසය ඇතුළු වංශකතා සාහිත්‍යයේ මහියංගණයේ සමන් දෙවියන් පිළිබඳ කියවෙන ස්ථානවල දී එම දෙවියන්ගේ සොහොයුරියක යැයි කියන මහලොකු මැණියන් පිළිබඳ සඳහන් නොවේ. බෞද්ධාගමික සම්ප්‍රදායට අයත් ඓතිහාසික ලේඛනයක දී මහලොකු මැණියන් පිළිබඳ සඳහන් වන ප්‍රථම අවස්ථාව ලෙස අපට හමු වන්නේ දඹදෙනියේ පරාක්‍රමබාහු කාලයේ දී වනවාසී සුභූති නම් භික්ෂුවක විසින් ලියන ලදැ'යි පැවසෙන 'මහා සුමන පුරාවෘත්ත' නම් පුස්කොළ පොතෙනි. එනමුදු මේ පුස්කොළ පොතේ අඩංගු විස්තරයේ විශ්වසනීයත්වය ගැටලු සහගත ය.[22] ඒ අනුව බලන විට පිළිගත් ශාස්ත්‍රීය

[21] දූනට දශක දෙකකට පමණ පෙර අපේ රටේ විශ්වවිද්‍යාලවල සිසුන් අතර ගැටුම් ඇති වූ අවස්ථාවල දී තමන්ට ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයේ අයගේ පසුපස පෙදෙස දූළි පිහිවලින් කපා දැමූ අවස්ථා අසන්නට ලැබී තිබේ.

[22] මේ පුස්කොළ පොත පිළිබඳ ව පළමුව සඳහන් කරන්නේ '*බින්තැන්නේ පුදබිම*' යන මැයෙන් 2004 වසරේ දී මහියංගණ පූජා භූමිය පිළිබඳ කෘතියක් පළ කළ ගාමිණී සූරිය ආරච්චි නම් ජනමාධ්‍යවේදියෙකි. ඔහුගේ කෘතිය පළ වීමෙන් පසු මොනරාගල, දූලිව අභිනවාරාමවාසී ටී. ධම්මින්ද නම් බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක විසින් 2007 වසරේ දී ලේඛකයාට එවූ ලිපියක 'මහා සුමන පුරාවෘත්ත' නම් තමන් වහන්සේ සතු පුස්කොළ පොතක් පිළිබඳව කියා තිබේ. මේ

සම්භාෂණයක දී මහලොකු මැණියන් පිළිබඳ ව සඳහන් වන ප්‍රථම අවස්ථාව ලෙස පෙන්වාදිය හැක්කේ සෙනරත් පරණවිතාන සමන් දෙවියන් පිළිබඳ ලියූ කෘතියේ සඳහන් සටහන යි. කෙසේ වෙතත් එහි දී පවා පරණවිතාන මහියංගණයේ දී තමන්ට අසන්නට ලැබුණු මහලොකු මැණියන් පිළිබඳ ජනශ්‍රැතිය ගැන කෙටි සටහනක් තැබීම හැර වැඩිදුර විශ්ලේෂණයකට ප්‍රවේශ වී නැත.

මේ කවර ලේඛනයක වුව ද මහලොකු මැණියන් බුදුදහම සරණ ගිය බවක් නොකියවේ. තමන් අතරින් ප්‍රතික්ෂේපිත සමන් දෙවියන්ට උපකාර කළ එම දෙවියන්ගේ සොහොයුරිය යැයි හඳුන්වන මහලොකු මැණියන් යක්ෂයන් හෙවත් දඩයක්කාර-ආහාර ද්‍රව්‍ය එක්රැස් කළ අයගෙන් පැවත එන වැද්දන් සහ වැද්දන්ගෙන් පැවත එන්නේ යැයි කියන සිංහල ජනතාව යන දෙකොටස ම අතර පිළිගැනීමට පාත්‍ර වීම වැද්දන් එම ප්‍රදේශයේ බලවත් ජන කොටසක් ව සිටීමේ පසුබිම තුළ තේරුම් ගත යුතු බව අපගේ අදහස යි. ක්‍රි. ව. 07 වන සියවසේ දී හියුං-සැන් කළ සඳහනකට අනුව යක්ෂයන් රටේ ගිනිකොණ දිග ප්‍රදේශවලට පසුබැස ගියේ යැයි අපි ඉහත සඳහන් කළෙමු. මහියංගණ ස්තූපය කෙන්ද්‍ර කර ගනිමින් බෞද්ධ ජනගහනයක් සිටින්නට ඇති වුවත් මේ ප්‍රදේශයේ බලවත් ජන කොටස වී ඇත්තේ වෘත්තියෙන් දඩයක්කාරයන් සහ ස්වකීය මිය ගිය නෑ යකුන් වන්දනා කළ පිරිස යි: " බින්තැන්න අලුත්නුවර වූ කලී වැද්දන් හා සිංහල බෞද්ධයන් හමු වූ ස්ථානයයි. එහෙත් එහි වඩා බලවත් ජන කොටස වූයේ වැද්දන්ය" යන ඔබේසේකරගේ (2018b: 246) මතය අපගේ මෙම අදහස තහවුරු කරයි. වැද්දන් සිය නෑ යකුන් ලෙස අදහන්නේ සිය මිය ගිය ඥාතීන් ය. මේ ආකාරයට ම වැද්දෝ මිය ගිය වැදි කාන්තාවන් ද අදහති. එසේ ඇදහීමට ලක් වන මිය ගිය වැදි කාන්තාවන් යනු, වැද්දන් අතර ප්‍රමුඛත්වයක් හිමි කර ගත් ඔවුන් අතර ගෞරවාදරයට පත් වූවන් ය. උඩරට රාජධානි සමයේ දී ප්‍රදේශ ගණනාවක් පාලනය කළ වැදි කාන්තාවන් පිළිබඳ ව ඓතිහාසික ලේඛනවල සඳහන් වේ (Lawrie, 1986; අබේවර්ධන, 1978). මහලොකු මැණියන් යනු වැද්දන් අතර එලෙස ගෞරවාදරයට පාත්‍ර වූ තැනැත්තියකි. කෙසේ වෙතත් වැද්දන් ලෙස නාමකරණය කළා වූ යක්ෂයන් සමන් දෙවියන්ට පහර දෙන විට ඔහු බේරාගත් මහලොකු මැණියන් වැද්දන් අතරේ දී ප්‍රතික්ෂේප නොවූයේ ඇය බුදුන්සරණ නොයෑම නිසා ය යන පිළිතුර හැර ඇය වැද්දන් අතරින් ප්‍රතික්ෂේප නොවීමට වෙනත් හේතුවක් අපට නොපෙනේ. ලංකාවේ ඉතිහාසය පුරා ම වැද්දන් සිංහලයන් වීමේ සහ සිංහලයන් වැද්දන් වීමේ ක්‍රියාවලියක් ද තිබුණු බව ඔබේසේකර සඳහන් කර ඇත. ඉඳින්

---

පුස්කොළ පොතෙහි අඩංගු විස්තරය මහාවංශ කතුවරයා විසින් ලංකා භූමිය කකුසඳ බුදුන්ගේ කාලයේ සිට බෞද්ධ රාජ්‍යයක් වීම පිළිබඳ ව විස්තර කරන කතා ප්‍රවෘත්තියට සමන් දෙවියන් ඇතුළත් කර අවසානයේ දී එම දෙවියන් ගෞතම බුදුරජාණන් වහන්සේගේ පරපුරට බන්ධුත්වයෙන් සම්බන්ධ කර එම දෙවියන්ගේ මූලාරම්භය සුජාතකරණය කිරීමකි. මේ පුස්කොළ පොතෙහි අඩංගු සමන් දෙවියන් සහ මහලොකු මැණියන් පිළිබඳ ඓතිහාසික විස්තරය මහාවංශ විස්තරයෙනුත් ඔබ්බට ගිය අතිශයෝක්තිකරණයකි.

මහියංගණයේ දී සිංහල වූ වැද්දන්ට ද තමන් පූර්වයේ දී ඇදහූ මහලොකු මැණියන් අමතක වන්නට ඇතැ'යි සිතිය නොහැකි ය.

## සමාලෝචනය සහ නිගමනය

මහාවංසය ඇතුළු ඓතිහාසික ලේඛනවල දී බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනය හා සම්බන්ධ කොට වර්තමාන ශ්‍රී ලංකාවේ බෞද්ධ දේව මණ්ඩලය තුළ ප්‍රමුඛස්ථානයකට පත් කර ඇති සමන් දෙවියන් පිළිබඳ ව මේ ලේඛනයේ දී අප ගොඩනැගූ අදහස් එකී ඓතිහාසික ලේඛනවල දී එම දෙවියන් පිළිබඳ ගොඩනගා ඇති විස්තරයට වඩා වෙනස් විග්‍රහයකි. උගත් යතිවරුන් විසින් රචනා කළා යැයි පිළිගැනෙන මහාවංසය ඇතුළු වංශකතාවල විධිමත් ව වාර්තාගත කර සිංහල බෞද්ධ ඉතිහාස ආඛ්‍යානයේ අධිපතිවාදී මතයක් බවට පත් කර තිබෙන සමන් දෙවියන් පිළිබඳ මතවාදය ජනශ්‍රැති සහ පුරාණෝක්ති ඔස්සේ අභියෝගයකට ලක් කරමින් නව අර්ථ කතනයක් අපි මෙහි දී ඉදිරිපත් කළෙමු.

අධිපතිවාදී ලේඛනවල 'ප්‍රාථමික' ජන කොටසක් ලෙස හැඳින්වෙන සහ 'නොදියුණු,' හා 'අශිෂ්ට' යන විශේෂණවලින් ජනප්‍රිය කතිකාවේ දී සඳහන් කරන වැදි ප්‍රජාව අතර තිබෙන ජනශ්‍රැති සහ පුරාණෝක්ති මගින් ස්ථාපිත ලිඛිත ඉතිහාසය අභියෝගයට ලක් කිරිම මෙහි දී සිදු විය. බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනය පිළිබඳ පුවතත්, සමන් දෙවියන් බුදුසරණ යාම පිළිබඳ පුවතත් ප්‍රමුඛ මහාවංසය සහ එයින් පසු ව ලියැ වී ඇති ඓතිහාසික වංශකතාවල දී විචිත්‍රවත් අලංකාරෝක්ති සහිත ව විස්තර කර ඇති ඓතිහාසික සිදුවීම් තුළ පවතින ප්‍රතිවිරෝධතා ඉස්මතු කරමින් ඒවායේ දී යටපත් කර ඇති අරුත් ගවේෂණය කිරීම ද මෙහි දී සිදු විය. බුද්ධචරිතය හා බුදුදහම පිළිබඳ නිල වශයෙන් සම්මත ප්‍රමුඛ ලේඛනය වන ත්‍රිපිටකයේ සඳහන් කරුණු අනුව උන්වහන්සේගේ ලංකාගමනය පිළිබඳ සම්භාවිතාව අවම අගයක පවතින බව ඉතිහාසඥයෝ පෙන්වා දෙති (දේවසිරි, 2019: 35). ලිඛිත ව තහවුරු වන සාක්ෂි අනුව මහාවංසය ලියැවෙන්නේ ක්‍රි. ව. 5 වැනි සියවසේ දී වන අතර ඒ වනාහී ප්‍රස්තුත කාරණා සිදු වී ශතවර්ෂ දහයකටත් පසු සිදු වූ සිදුවීමකි. මහාවංසයේ මුල් පරිච්ඡේද ලියැ වී ඇත්තේ මහාවංසයට සුළු කලකට පෙර රචිත දීපවංසය සහ වෙනත් සමහර පාලි මූලාශ්‍රය පදනම් කර ගෙන බව විචාරක මතය යි. වඩා පැරණි වංශකතාව වන දීපවංසයේ සමන් දෙවියන් පිළිබඳ කිසිදු සඳහනක් නැත්තා සේ ම ශ්‍රීපාද මස්තකයේ බුදුරජාණන් වහන්සේගේ සිරිපතුල පිහිටු වීම පිළිබඳ සටහනක් ද නැත. එසේ ම ක්‍රි. ව. 5 වැනි සියවසේ ලංකාවට පැමිණ ත්‍රිපිටකය පාලි භාෂාවට පරිවර්තනය කළ බුද්ධඝෝෂ හිමියන් සමන්තපාසාදිකාවට ලියූ හැඳින්වීමේ ද සමන් දෙවියන් හෝ ශ්‍රීපාද මස්තකයේ බුදුරජාණන් වහන්සේගේ සිරිපතුල පිහිටු වීම පිළිබඳ සටහනක් නැත. දීපවංසයේ එතරම් විස්තරාත්මක ව සඳහන් නොවන බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනය, විජයගේ පැමිණීම වැනි සිදුවීම් මහාවංසය, පූජාවලිය වැනි පශ්චාත් කාලීන ඓතිහාසික කෘතීන්වල දීර්ඝ වශයෙන් ලියැ වී

තිබේ. ඒ අනුව බලන විට ලංකා ඉතිහාසයේ මුල් යුගය පිළිබඳ කියවෙන කතා පුවත්වල සඳහන් සිදුවීම් සහ එම සිදුවීම්වල සඳහන් වන සමන් දෙවියන් වැනි පුද්ගල චරිතවල විශ්වසනීයත්වය විවාදාත්මක ය.

"ඉතිහාසය යන යෙදුම ගැන ඇති අපේ අර්ථයෙන් සලකන විට පුරාණෝක්තීන් යනු ඉතිහාසය නොවිය හැකිය. එහෙත් ඒවා පැන නඟින්නේ ඓතිහාසික සංදර්භයක් තුළිනි" යන ගණනාථ ඔබේසේකරගේ අදහස (2018a: 202) සලකා බලන විට ඓතිහාසික වශයෙන් විවාදාපන්න බවක් තිබුණ ද මෙම සිදුවීම් සහ චරිතවලින් ගම්‍ය වන සමාජවිද්‍යාත්මක හා කෘත්‍යාත්මක වැදගත්කම මුළුමනින් ම නොතකා හැරීමට සමාජවිද්‍යාඥයෙකුට නො-හැකිය. ලංකාව ශිෂ්ටාචාරගත වීම පිළිබඳව මහාවංසය ඇතුළු ස්ථාපිත ඓතිහාසික වංශකතාවල ඇතුළත් අතිශයෝක්තිගත විචිත්‍රවත් කතා ප්‍රවෘත්ති සහ විස්තරකරණවලදී නොකියවෙන සැඟවී ගිය ආඛ්‍යාන තිබෙන බව අමතක නොකළ යුතුය. එම අර්ථයෙන් ගත් කල, ලංකාවේ පූර්ව බෞද්ධ යුගයේ සිට සිදු වූ විසිර සිටි දේශීය ජන කණ්ඩායම් අධිපතිවාදී සමාජ ප්‍රවාහයට අන්තර්ගත කර ගැනීම, නිෂේධනය කිරීම හෝ බැහැර කිරීම පිළිබඳ ක්‍රියාවලියක නොකියවුණු පැතිකඩක් සමන් දෙවියන් පිළිබඳ මහියංගණ-කේන්ද්‍රීය ජනශ්‍රැති සහ පුරාණෝක්තිවලින් ගම්‍ය වන බව අපි පැහැදිලි කළෙමු. එසේම මෙහිදී අප පෙන්වා දෙන්නේ මෙම ක්‍රියාවලිය ලෝක ඉතිහාසයේ දී බලවත් ජන කණ්ඩායම් ජනාවාස පිහිටුවා ගැනීමට වෙනත් ප්‍රදේශවලට ගිය විට එම ප්‍රදේශවල වාසය කළ ස්වදේශික ජනයා සම්බන්ධයෙන් දක්වා ඇති ප්‍රතිචාරවල ලාංකේය ආඛ්‍යානය බවයි. කෙසේ වෙතත්, එසේ නිෂේධනය කළ හෝ බැහැර කළ කණ්ඩායම් නව සංක්‍රමණික බලවත් ජන කණ්ඩායම්වලින් තමන් වෙත එල්ල වූ නිෂේධනාත්මක බලපෑම නොඉවසා සිටියේ නැත. එසේම, තමා යටපත් කළ බලවත් 'අනෙකාට' ස්වදේශිකයන්ගේ භූමිය තුළ ස්ථාපිත වීමට උපකාර කරමින් එම කණ්ඩායම්වල සංස්කෘතිය සමඟ එක් වූ 'ස්වකීයයන්' සම්බන්ධයෙන් විරෝධයක් නොතිබුණේ යැයිද කිව නො-හැකිය.

එහෙත් එකී විරෝධය මහාවංසය ඇතුළු ඓතිහාසික වංශකතාවල වාර්තා කොට නැත්තේ ඉතිහාසය ලියැවුණේ බලවත් 'අනෙකාගේ'දෘෂ්ටි කෝණයෙන් මිස විපතට පත් අයගේ දෘෂ්ටි කෝණයෙන් නොවූ නිසා ය.[23] ලංකාවේ දී දේශපාලනික සහ සංස්කෘතික වශයෙන් බලවත් ස්ථානයක් අත්පත් කරගත් නව සංක්‍රමණිකයන් තමන්ගේ ආරම්භය පිළිබඳ පුරාණෝක්ති නිර්මාණය කිරීමේ දී දේශපාලනික සහ සමාජ-සංස්කෘතික වශයෙන් තමන් සතු වූ අධිකාරී බලය මුල් කර ගනිමින් තමන් විසින් යටපත් කළා වූ සහ තමන්ගේ දෘෂ්ටි කෝණයෙන්

23 ලිඛිත සම්ප්‍රදායක් තිබුණ ද බලවත් ජාතීන් විසින් ඉතා මෑත කාලයේ, එනම් 19 වන සියවසේ මුල් භාගයේ යටත් කරන ලද අයගේ කතාව පවා ඔවුන්ගේ දෘෂ්ටි කෝණයෙන් සැබෑ වශයෙන් ලියැවී නැති බව බ්‍රිතාන්‍යන් විසින් උඩරට රාජධානිය ආක්‍රමණය කළ ආකාරය පිළිබඳව ලියන ඉංග්‍රීසි ලේඛකයකු වන ජෙප්‍රි පවෙල් (2009: 5) කියයි.

'පහත්' යැයි නිර්ණය කරන ලද අනෙකාගේ අනන්‍යතාව මකා දැමීමේ ප්‍රවේශයක් වෙත යොමු වීම මෙන් ම අනන්‍යතාව මකා දැමූ අනෙකාට සාපේක්ෂ ව තමන්ගේ කණ්ඩායමේ උදාරත්වය නිරූපණය කිරීමට පෙළඹීම නිසැක ය. මෙම සන්දර්භයේ දී, දේවසිරි පෙන්වා දෙන ආකාරයට, තමන් විසින් විනාශ කරනු ලැබූ සතුරාට මනුෂ්‍යභාවය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම තමන්ගේ සුජාත භාවය තහවුරු කර ගැනීමේ කතිකාමය උපාය මාර්ගයකි (2019: 40). එනම්, ආගන්තුක බලවත් ජන කණ්ඩායම ස්වදේශිකයන් පලවා හැර නව භූමියේ තමන් ස්ථාපිත වීමේ ක්‍රියාවලිය සාධාරණීකරනය කර ගැනීමකි. ආරම්භක පරිච්ඡේදයේ දී ම මහාවංසය බුදුරජාණන් වහන්සේ මහියංගණයට වැඩම කරවන්නේ සහ යක්ෂයන් අවමානුෂික කණ්ඩායමක් ලෙස නම් කර බුදුරජාණන් වහන්සේ ලවා ගිරි නම් දිවයිනට පලවා හරින්නේ මේ අර්ථයෙනි. එයින් අනතුරුව විජය-කුවේණි කතා ප්‍රවෘත්තියේ දී කුවේණිය ලවා වෙස් මාරු කරවීම්, අතුරුදහන් කරවීම් කරවන්නේ ද ඒ අර්ථයෙනි. මේ අනුව මහාවංසය සිංහල බෞද්ධ බල ව්‍යූහමය කතිකාවක් ඔස්සේ නව සංක්‍රමණිකයන්ට එරෙහි වූ 'අනෙකා' අවමානුෂකකරණය කර ඔහුගේ අනන්‍යතාව මකා දමයි. විජය-කුවේණි දෙපලට දාව උපන් දරුවන්ට පවා මේ කතිකාව තුළ දී නව සංක්‍රමණිකයන් හා සමාන තත්ත්වයක් ලබා නොදේ.[24] මහාවංසය ඔවුන් හඳුන්වන්නේ 'පුලින්දයන්' යන නමිනි.[25]

තමන්ට වඩා බලවත් දේශපාලනික සහ සංස්කෘතික ප්‍රවාහයක් විසින් පීඩාවට හා අවමානුෂීකරණයට ලක් කරන ලද දඩයක්කාර හා ආහාර ද්‍රව්‍ය ඒකරාශි කළ ජනතාවට තමන් පීඩාවට පත් කළ ක්‍රියාවලියට එරෙහිව සිය ප්‍රතිචාර ලියා තැබීමට ලිඛිත වාර්තාකරන සම්ප්‍රදායක් නොතිබිණි. එනමුදු අධිපතිවාදී අර්ථ ක්‍රමයට සහ බලවත් සංස්කෘතියට අනුගත නොවී පසුබැස ගිය පිරිස අතර 'බලවත් අනෙකා' පිළිබඳ ව මෙන් ම එකී අනෙකාට එක් වූ 'ස්වකීයයන්' පිළිබඳ අමිහිරි මතකයක් ශේෂ වන්නට ඇත. අධිපතිවාදී සංස්කෘතිය තුළ එකී සංස්කෘතියට අනුගත නොවී ජීවත් වූ ඔවුන්ගේ ඊළඟ පරම්පරාවල සාමාජිකයන්ට 'බලවත් අනෙකා' විසින් තමන් අබිබවනය කිරීම මෙන් ම තමන්ගෙන් ඔවුන්ට එක් වූ 'ස්වකීයයා' පිළිබඳ ලියැවුණු කතා ප්‍රවෘත්ති ද ඇසීමට ලැබෙන්නට ඇත. ඒ අනුව තමන් පීඩාවට පත් කළ ක්‍රියාවලියට එරෙහි ඔවුන්ගේ ප්‍රතිචාර ද සම්පූර්ණයෙන් ම නොවූවත් ජනශ්‍රැති සහ පුරාණෝක්ති ලෙසින් යම් තරමකින් හෝ පැවත ආ බව පෙනේ. වර්තමානයේ දී අපි

---

24 සිරිසඟබෝ රජතුමාට දානය පිළිගැන්වූ මගියා සිය ආහාර පිළිගන්නා ලෙස ආයාචනා කරන්නේ "මම හීන ජාතියෙන්හි උපන්වූ එකෙක් නොවෙමි. පර පණ නසා ජීවත් වන්නා වූ වැදි, පදු, කෙවුල් ආදී එකෙකුත් නොවෙමි" යනාදී වචනවලිනි (එළු අත්තනගලු වංශය, මකුළුදූවේ පියරතන සංස්කරණය, 1987: 53).

25 හෙන්රි පාකර්ට (1992) අනුව 'පුලින්ද' යන වචනය ඉන්දියාවේදී වනචාරී ගෝත්‍රිකයින් හැඳින්වීම සඳහා යෙදෙන්නකි. වින්ධ්‍යා කඳුකරවාසි පුලින්දයන්ට සම්බන්ධ හිමාලයානු ගෝත්‍ර (උදා: කිර්ටාස්, තන්ගනාස්) මෙන්ම දකුණු ප්‍රදේශවාසී කඳුකර ගෝත්‍ර රැසක් ද සිටී බව කියැවේ (Sircar, 1990). මෙම ගෝත්‍ර වනචාරින් ලෙස පහත් කොට සලකන ලද්දේ යැයි කියූවත් එම අදහසට එකඟ නොවන අය ද සිටිති.

මහියංගණ-කේන්ද්‍රීය ජනශ්‍රැති සහ පුරාණෝක්ති ලෙසින් අසන්නේ සහ දකින්නේ එකී ශේෂය යි. සිංහල බෞද්ධයන් අතරේ ජීවත් වීම නිසා අධිපතිවාදී සම්ප්‍රදාය විසින් ලියා තහවුරු කරන ලද අතිශයෝක්ති සහගත පරිකල්පනීය ඉතිහාස කතා ප්‍රවෘත්තියේ අඩංගු වූ දේවල් ද එම ජනශ්‍රැති සහ පුරාණෝක්ති චිත්‍රයට ඇතුළු වන්නට ඇත. බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනය, විජය-කුවේණි කතා ප්‍රවෘත්තිය වැද්දන්ගේ ජනශ්‍රැති සහ පුරාණෝක්තිවලට ඇතුළු වන්නට ඇත්තේ එපරිද්දෙනි.

කෙසේ වෙතත්, බලවත් සිංහල බෞද්ධ සංස්කෘතියට අනුගත නොවී, එහෙත් රාජ්‍ය ව්‍යූහයට එක් වී බුදුරාජාණන් වහන්සේ විසින් යක්ෂයන් පලවා හැරි බව කියැවෙන මහියංගණයේ දී ම තමන් බලවත් වූ විට, බලවත් අනෙකා පිළිබඳ පැවති විරෝධය සංකේතාත්මක ව හෝ ප්‍රකාශ කිරීමට ඔවුන්ට ඉඩ ලැබෙන්නට ඇත. වැදි පෙරහැර ආශ්‍රිත යාතුකර්ම-වත්පිළිවෙත් ඔස්සේ අද පවා අපි දකින්නේ එම විරෝධය පෑම යි. කෙසේ වෙතත්, 19 වන සියවසේ දී වැද්දන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස සීමා කළා වූ විවිධ සාධක හමුවේ සංඛ්‍යාවෙන් මෙන් ම බලයෙන් ද දුබල පිරිසක් බවට පත් ව, 1930 ගණන්වලින් පසු ගොවිජනපද ව්‍යාපාරය සහ 1980 ගණන්වල මහවැලි සංවර්ධන ව්‍යාපාරය හමුවේ තවදුරටත් සිංහල බෞද්ධකරණය වීමට වැද්දන්ට බලකරන ලද්දේ වී නමුදු තවමත් තමන් වැද්දන් වශයෙන් හඳුන්වා ගන්නා පිරිස සහ තමන් ද වැද්දන්ගෙන් පැවත එන්නේ යැයි කියන ප්‍රදේශයේ සිංහල ජනතාව අතර ශේෂ ව තිබෙන ජනශ්‍රැති, පුරාණෝක්ති සහ යාතුකර්මවලින් බලවත් අනෙකා පිළිබඳ පැවති විරෝධය යම් ප්‍රමාණයකට හෝ පිළිබිඹු වෙයි. එපමණක් නොව, වැද්දන්ගෙන් පැවත එන වර්තමාන තරුණ පරම්පරාවේ උගත් අදහස්වලින් ද බලවත් අනෙකා කෙරෙහි පැවති විරෝධය මෙන් ම එකී අනෙකා සමඟ එක් වූ 'ස්වකීයයා' පිළිබඳ පැවති විරෝධය පිළිබිඹු වෙයි. ස්වකීය දර්ශනපති උපාධිය සඳහා වැද්දන් පිළිබඳ පර්යේෂණයක් කළ පර්යේෂකයෙකුට කලින් දඹාන කන්දෙගන්විල ප්‍රදේශයේ පදිංචිව සිට මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ හෙන්නානිගල පදිංචි කොට ඇති වැදි ජනතාවගෙන් පැවත එන අ.පො.ස සා.පෙළ සමත් තලාවරිගේ පුංචිබණ්ඩා ස්වකීය සම්භවය පිළිබඳ පවසන ආකාරය බලන්නː "අපේ පරම්පරාව අවුරුදු 35000කටත් ඉහළින් හිටියා. බුදුහාමුදුරුවො බුදුවෙලා මාස නමේකට පස්සේ මහියංගණයට වැඩියා. ඒ වෙන කොටත් හිටියා කුවේණි. කුවේණිය අපේ පරම්පරාවේ සාමාජිකාවක් මිස එයාගෙන් අපි පැවතෙන්නේ නෑ" (ගලගමගේ, 2018ː 122).

සමන් දෙවියන්, කුවේණි, විජය, යනාදි මෙකී චරිත සැබවින් ම ලංකාවේ ඉතිහාසය තුළ සිටියා හෝ නොසිටියා වන්නට පුළුවන. කෙසේ වෙතත්, උයන්ගොඩ පෙන්වා දෙන ආකාරයට විසිවන සියවසේ දී මහාවංසය සිංහලට පරිවර්තනය කිරීමත්, මහාවංසය ඉදිරිපත් කළ ඓතිහාසික වෘත්තාන්තය ලංකා ජාතික රාජ්‍යය පිළිබඳ දේශපාලන පරිකල්පනයේ

කේන්ද්‍රය බවට පත් කරගනු ලැබීමත් සිංහල සමාජය තුළ සිදු විය (2019: xvii-xviii). එලෙස විසිවන සියවසෙන් ආරම්භ වූ ලංකා භූමියේ හිමිකාරීත්වය පිළිබඳ නූතන වාග් සටන් ඇදී ගිය දුර අප දක ඇති අතර භූමියේ හිමිකාරීත්වය නම් සංකල්පය කේන්ද්‍ර කර ගනිමින් මේ මොහොතේ ද එය අඩු වැඩි වශයෙන් සිදු වෙමින් පවතින බව නිරීක්ෂණය කළ හැකි ය. මහාශ්වෙතා දේවි (2015) පවසන පරිදි 'ජනශ්‍රැති ඉතිහාසය' සමඟ කෙළින් සිටුවා බැලීමෙන් ඉතිහාසයේ දී සැබවින් ම සිදු වී ඇත්තේ කුමක් ද යන්න පිළිබඳ යම් අවබෝධයක් ගොඩනගා ගත හැකි ය. මහියංගණයේ ජනතාව අතර ශේෂ ව පවතින ජනශ්‍රැති සහ පුරාණෝක්ති මෙන් ම මහලොකු මැණියන්, මිණීපුලුටි වැනි එම ජනශ්‍රැති සහ පුරාණෝක්තිවල ඇතුළත් චරිත හා සම්බන්ධ ඉතිහාසය අපට වැදගත් වන්නේ ඒ අර්ථයෙනි. ඉතිහාසය එලෙස විශ්ලේෂණය කර ගැනීමෙන් ලැබෙන අවබෝධය, එක් එක් ජන කොටස් ලංකාවේ ඓතිහාසික උරුමය කියාපෑමට දරන උත්සාහය නිසා නිර්මාණය වී ඇති වියවුල්කාරී සමාජ පසුබිම පිළිබඳ නැවත නැවත සිතා බැලීමට අප යොමු කරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අදිකාරම්, ඊ. ඩබ්ලිව්. (2003) *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

අබේවර්ධන, එච්. ඒ. පී. (1978) *කඩඉම් පොත් විමර්ශනය.* කොළඹ: සංස්කෘතික අමාත්‍යාංශය

උයන්ගොඩ, ජයදේව (2019) 'පෙරවදන.' *ලංකාවේ ඉතිහාසය: දෘෂ්ටිවාද විචාරයක්* (දේවසිරි, නිර්මාල් රංජිත්) කොළඹ: විදර්ශන ප්‍රකාශන

*එළුඅත්තනගලු වංශය* (සංස්. මකුළුදූවේ පියරතන හිමි) (1987) කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

ඔබේසේකර, ගණනාථ (2018a) 'ගජබාහු සහ සෙන්කුට්ටුවන්: සංස්කෘතික වීරයින් සහ ජනපදකරණ පුරාණෝක්ති' (පරි: කසුන් සේනානායක). *ගණනාතගේ රචනා: ගණනාත් ඔබේසේකර විසින් රචිත ලිපි දොළොසක සිංහල පරිවර්තනය.* කැලණිය විශ්වවිද්‍යාලය: සමාජීය විද්‍යා පීඨ පර්යේෂණ මධ්‍යස්ථානය

--------------- (2018b) 'යටත්විජිත ඉතිහාස ලේඛන හා වැද්දා පිළිබඳ ප්‍රාථමිකතාවාදය: නුවර යුගයේ ලේඛන පිළිබඳ විසම්මුතික කියැවීමක්' (පරි: චින්තක රණසිංහ). *ගණනාතගේ රචනා: ගණනාත් ඔබේසේකර විසින් රචිත ලිපි දොළොසක සිංහල පරිවර්තනය.* කැලණිය විශ්වවිද්‍යාලය: සමාජීය විද්‍යා පීඨ පර්යේෂණ මධ්‍යස්ථානය

-------------- (2018c) 'බුදුදහම, ජාතිකත්වය හා සංස්කෘතික අනන්‍යතාව: පූර්ව-නූතන හා පූර්ව-යටත්විජිත සැකැස්ම' (පරි: ඩිල්මා තුෂාරි කොග්ගලගේ). *ගණනාතගේ රචනා: ගණනාත් ඔබේසේකර විසින් රචිත ලිපි දොළොසක සිංහල පරිවර්තනය.* කැලණිය විශ්වවිද්‍යාලය: සමාජීය විද්‍යා පීඨ පර්යේෂණ මධ්‍යස්ථානය

*ගන දෙවි හැල්ල සහ වදන් කවි පොත* (සංස්: තුම්බෝවිල ධම්මරතන හිමි) (2015). දෙහිවල: ශ්‍රීදේවී ප්‍රින්ටර්ස්

ගලගමගේ, ප්‍රභාත් (2018) *වැද්දෝ කොහි යාදෝ? අධිපති සංස්කෘතීන්, සුළුජන කණ්ඩායම් හා ජනවාර්ගික අනන්‍යතාව: සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ගුණවර්ධන, තේජා (1979) *කොහොඹා කංකාරිය.* කොළඹ: අරුණ ප්‍රකාශකයෝ

ගොඩකුඹුර, චාල්ස් (1963) *කොහොඹා කංකාරිය.* සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ද සිල්වා. සුගතපාල (1964) *දඹානේ වැදි බස.* සරසවි ප්‍රකාශකයෝ

*දීපවංශය* (සංස්: කිරිඇල්ලේ ඤාණවිමල) (1959) කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

දේවසිරි, නිර්මාල් රංජිත් (2019) *ලංකාවේ ඉතිහාසය: දෘෂ්ටිවාද විචාරයක්.* කොළඹ: විදර්ශන ප්‍රකාශන

ධර්මදාස, කේ. එන්. ඕ. සහ එච්. එම්. එස්. තුන්දෙනිය (1994) *සිංහල දේව පුරාණය.* කොළඹ: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

පවෙල්, ජෙෆ්‍රි (2009) *කන්ද උඩ රට සටන්* (*Kandyan Wars*) *කෘතියේ සිංහල පරිවර්තනය.* පරි. ප්‍රේමචන්ද්‍ර අල්විස්). කොළඹ: සූරිය ප්‍රකාශකයෝ

*පූජාවලී* (සංස්: ඒ. වී. සුරවීර ඇතුලු අය) (1998) කොළඹ: ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2000) *චීනතෙරුන්ගේ ගමන් විස්තර සහ හියුං සියං භ්‍රමණවෘත්තාන්තය.* කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ

*මහාවංශය* (සංස්: ශ්‍රී සුමංගල-බටුවන්තුඩාවේ දේවරක්ෂිත) (1996) කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ

මහාශ්වේතා දේවී (2015) *ඉස්කෝලේ මහත්තයා* (*Master Sabb* නම් කෘතියේ සිංහල පරිවර්තනය. පරි: උපුල් රංජිත් විදානගමගේ). කොළඹ: ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්)ලිමිටඩ්

මීගස්කුඹුර, පී. බී. (1991) 'ඌවේ වැදි ජන පුරාණය.' *ඌව වංශ කථාව - 2 කාණ්ඩය* (සංස්: වි.වා.මු. තිලකසිරි බණ්ඩාර) ඌව පළාත් සභා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

--------------- (1985) 'වැදි ජනයා.' *මහවැලි වංශය - 2 කාණ්ඩය*, මහවැලි සංවර්ධන අමාත්‍යාංශය

රත්නපාල, ඊ. එම්. (2003) *ලංකාවේ වැද්දෝ.* වරකපොල: ආරිය ප්‍රකාශකයෝ

--------------- (1996) *සමන්තකූටය, ශ්‍රී පාදස්ථානය හා ජනශ්‍රැති.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

---------------- (1992) *සමන් දෙවියෝ.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

*වංසත්ථප්පකාසිනී මහාවංස ටීකාව* (අකුරැටියේ අමරවංස-හේමචන්ද්‍ර දිසානායක අනුවාදය) (2001) කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

වික්‍රමගමගේ, චන්ද්‍රා (2006) *ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

විපස්සි, රඹුක්වැල්ලේ (2005) *සමන්තපාසාදිකා බාහිර නිධාන වර්ණනා.* කොළඹ: සමයවර්ධන

සමරසිංහ, එස්. ජී (1992) 'සමන් දෙවියෝ.' *ඓතිහාසික රත්නපුර* (සංස්: බන්දුල ලියනගේ) රත්නපුර: සබරගමු පලාත් සභාව

සාසනරතන හිමි, මොරටුවේ (1999) *ලක්දිව මහායාන අදහස්.* බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ

*සැළලිහිණි සන්දේශය* (සංස්: පී. එස්. බී. සේනානායක) (1990) කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ

සූරිය ආරච්චි, ගාමිණී (2004) *බින්තැන්නේ පුදබිම.* මහරගම: තරංජී ප්‍රින්ටර්ස්

*හංස සංදේශය* (සංස්: සී. ඊ. ගොඩකුඹුර) (1953) කොළඹ: සීමාසහිත ඇපොතිකරීස් සමාගම

Cartwright, Mark (2013) *Montezuma*, in https://www.worldhistory.org/Montezuma/ Accessed date 11.11.2021

https://www.history.com/topics/native-american-history/trail-of-tears Accessed date 08.11.2021

Lawrie, A. Campbell. (1986). *A gazetteer of the Central Province of Ceylon (excluding Walapane).* Sri Lanka: State Printing Corporation

Mills, C. Wright (1959) *The Sociological Imagination.* Oxford: Oxford University Press

Obeyesekere, Gananath (1984) *The Cult of the Goddess Pattini.* Chicago and London: The University of Chicago Press

----------------- Gananath (2002) *Colonial Histories and Vadda Primitivism: An Unorthodox Reading of Kandy period Texts.* Colombo: G.C. Mendis Memoriel Foundation

----------------- Gananath (2004) *Buddhism, Nationalism and Cultural Identity: The Premodern and Pre-Colonial Formations.* Clombo: International Center for Ethnic Studies

Paranavitana, Senerath (1928) 'Mahayanism in Ceylon. *Ceylon Journal of Science, Vol. II, December 31*

----------------- (1970) *Inscriptions of Ceylon*. Vol. I, Colombo: Department of Archeology

----------------- (1958) *The God of Adam's Peak*. Ascona, Switzerland: Artibus Asiae Publishers

Parker, Henry (1981[1909]) *Ancient Ceylon*. New Delhi: Asian Educational Service

Robinson, M.S (1968) 'The House of the Might Hero of enough Paddy?: Some Implications of a Sinhalese Myth.' in *Dialect in Practical Religion*, ed. E.R. Leach. Cambridge: Cambridge University Press

Sircar, D.C. (1990) *Studies in the Geography of Ancient and Medieval India*. New Delhi: Motilal Banarsidass Publishers

Thapar, Romila (2002) *Penguin History of Early India: From the Origins to AD 1300*. New Delhi: Penguin Books Ltd

Upham, Edward (2011[1829]) *The History and Doctrine of Buddhism, Populary Illustrated.* Nabu Press